භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2026 ජනවාරි - පෙබරවාරි | 127 වන කාණ්ඩය - 01 කලාපය | පිටු 32 | DOP/MAGAZINE/03/2026

## ආපදා හමුවේ ක්‍රිස්තු අනුගාමිකයා

## මත් රසින් මත් වී



ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

# මත් රසින් මත් වී

ගී පද - එමාඩි දල්පතාදු නි.ම.නි. පියතුමා
තනු නිර්මාණය - ආචාර්ය රෝහණ වීරසිංහ



දින දින මත් රසයෙන් මත් වී
බමන ගතින් ගිනි වතුරෙ දැවී
කොයි යන්නෙ ද මේ වියරු වී
ජීවන මඟ මංමුළා වී

මත් රසයට නිති ලොල් වීලා
පැහැපත්කම ගත වියැකීලා
තුරුණු සවිය වියපත් වීලා
සිත යයි සුළඟේ පාවීලා

දහම් හරය උකසට තියලා
මිනිසත්කම තිරිසන් කරලා
සිය දහසින් විපතේ වැටිලා
හරි වැරැද්ද යයි බොඳ වීලා

හදින් හදට සැම එකතු වෙලා
කුලුණු බරින් පහදා දීලා
දහම් පහන හද දල්වාලා
එතෙර කරමු බැමි ලිහවාලා

මත් රකුසා මුළු සිරිලක් දීපය ම තමන්ගේ ග්‍රහණයට ගෙන ඇත. මීට දශක තුන හතරකට ඉහත දී ඌ පැමිණියේ 'මත්පැන්' වේශයෙන් පමණකි. එහෙත් අද වන විට 'මත්කුඩු' ලෙස ද, 'මත්පෙති' ලෙස ද, 'මත්පැණි' ලෙස ද විවිධ වෙස් ගෙන, කාටත් හොරා දෙරණ සිසාරා ඌ තම බලය පතුරුවා ගෙන ඇත. රටක් ලෙස වියරුවෙන් මෙන් මංමුළා වී අපි ගමන් කරන්නේ උගේ විනාශකාරී මුඛය තුළට ම ය. කනගාටුවට කරුණ නම් අප තවමත් එය වටහාගෙන නොමැති වීම ය.

මත්පැන් සහ මත්ද්‍රව්‍යවලට ඇති ඇබ්බැහිකම නිසා සිදු වන අහිතකර ප්‍රතිවිපාක ගැන රචකයා ඉන්පසු විස්තර කරයි. මුහුණ විරූපී වේ, ශරීරය ඉක්මනින් වියපත් වේ, ශක්තිය කෙමෙන් වැහැරේ, සිත ඒකාග්‍ර කර ගැන්මට නො හැකි වේ. නමුත් අවාසනාවක මහත ! මේ සියල්ල එලෙස ම සිදුවද්දී, මිනිසා මත් රසයට තව තවත් ලොල් වේ.

ඕනෑ ම ආගමක හරය වන්නේ මිනිසාව මිනිසත්කමින් පොහොසත් කිරීම යි. හරි වැරැද්ද වෙන්කර ගැන්මට මග සලසමින්, පාපකාරී ක්‍රියාවන්ගෙන් බැහැර කරවමින්, මිනිසාව හික්මුණු ජීවිතයකට හුරු කරවීම යි. නමුදු, මතට ඇබ්බැහි වූ කෙණෙහිම, දහම් හරය උකසට තැබෙන බවත්, මිනිසත්කම තිරිසන්කමට හැරෙන බවත්, හරි වැරැද්ද වෙන්කර ගැන්මට නො හැකි තරම් මනස විකෘති වන බවත් රචකයා ප්‍රකාශ කරයි. මේ විනාශයේ ප්‍රබලකම කෙතරම් ද කිවහොත්, එය බලපාන්නේ මතට ලොල් වුවන්ට පමණක් නොවේ. ඔවුන්ගේ පවුල්වල අයට මෙන් ම, සමස්ත සමාජයට ම එය ශාපයකි.

මේ ශාපයෙන් අප මිදෙන්නේ කෙසේ ද? මත් රකුසාව අප දේශයෙන් පන්නා දමන්නේ කෙසේ ද? රචකයාට අනුව, රකුසු කටට ගොදුරු වූවන් ව ඉන් මුදා ගැනීමට නම් සියලු දෙනා පක්ෂ, පාට, ජාති භේද හැරදා එකාවන් ව නැඟී සිටීම අත්‍යවශ්‍ය වේ. නිවී ගිය දහම් පහන නැවත දැල්විය යුතු වේ. ඒ සඳහා ආගම් භේද ඉවත ලා ක්‍රියා කළ යුතු වේ.

එසේ වී නම්, මතින් නිවහල් රටක් කරා එතෙර වීමේ බලාපොරොත්තුවේ සිහිනය අපට සාක්ෂාත් කර ගැන්මට හැකියාව ලැබේ.

ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා

# භක්ති ප්‍රබෝධනය

**2026 ජනවාරි - පෙබරවාරි**

ප්‍රකාශනය
නිර්මල මරිය නිකාය

භාරකරු
අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

සංස්කාරක
ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

සංස්කරණ සහය
රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ලහිරු දරණකුඹුර

කවර නිර්මාණය
අචල රූපසිංහ

පරිගණක පිටු සැකසුම
නිලුමිණ හර්ෂාන්


මුද්‍රණය
එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.

## පිටුවෙන් පිටුව..........

2 කවරයේ කථාව
3 ආපදාව හමුවේ ක්‍රිස්තු අනුගාමිකයා
එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා
4 හෙළිදරව්ව
6 අප කුමට ඇබ්බැහි වී ... - ශෙලින්ඩා සමරසිංහ
7 බලයෙන් මත් වී ... - ලූෂන් එඩ්වඩ් පෙරේරා
8 මතට තිත : සමිඳු වත - බුද්ධික සඳරුවන්
10 මත් (නි) රසින් මිදි රටක්? - නීටා අයි. ප්‍රනාන්දු
11 මත, ලොල්වීම ... - වෛද්‍ය සචිත මෙන්ඩිස්
12 මතින් තොර නිදහස් ... - සඳුනි වාසනා පින්තු
13 රසින් රස මත් වී - අයිරින් කොස්තා
14 මත් රසේ සාතන්ලා - අයිරාංගනී ලියනගේ
15 'භක්ති ප්‍රබෝධනය' ... - ටී. සුනිල් ප්‍රනාන්දු
සුන්දර සඳ ... - කීර්ති සඳරුවන් ප්‍රනාන්දු
16 කෙටි කතාව - ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න
18 ජීවිතය සුන්දර ද මෙතරම් ? - කාමන් සකුන්තලා
19 නත්තල ආවා. අපට කියන්නට රාලේ
එම්. ජී. ඩික්සන් ක්‍රිස්ටෝපර් ෆර්ඩිනැන්ඩස්
20 ශු. ජෝන් බොස්කෝ ... - මලින්ත බෝපෙආරච්චි
21 මත් රසින් මත් නොවී - පස්කල් ජයමාන්න
22 **Drugs are dangerous and harmful ...**
Godfrey Cooray
24 ඕං එහෙනං - රූපස් ප්‍රැන්සිස්
25 කාව සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත
26 පුංචි විකුම් - තරු නැන්දා
27 ප්‍රහේලිකා අංක - 89
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා
28 ප්‍රහේලිකා අංක 87 පිළිතුරු හා ජයග්‍රහණ
29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය II
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය
31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව යි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළ වන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)




## කවරයේ කථාව

ස්වභාව ධර්මය නිර්මාණය වී ඇත්තේ ම වෙනස් වන්නට ය. මිහිතලයේ ජීවය රැකගන්නේ ද ඒ වෙනස් වීම නිසා ම ය. ස්වාභාවික ආපදාවක් යනු අපට ආපදාවක් වුව ද ස්වභාව ධර්මයට ස්වභාවයට විරුද්ධ මිනිස් ක්‍රියාවල අනිසි බලපෑම් යථා තත්ත්වයට පත් කර ගැනීමකි. කිතුනුවකු ලෙස ආපදා හමුවේ අසරණ වූවන් හට පිළිසරණක් වෙනවා සේ ම සොබා දහම පවසන පණිවුඩය ද ප්‍රඥාවෙන් වටහා ගෙන නැවත මෙවන් තත්ත්ව ඇති නො වන ලෙසට ස්වභාව ධර්මයට ප්‍රේමයෙන් කටයුතු කරන්නටත් අනෙකාව එයට යොමු කරන්නටත් මෙවර කවරය ඇරයුම් කරයි. මේ ආපදා මධ්‍යයේ මෙයටත් වඩා බිහිසුණු ආපදාවක් කාලන්තරයක සිට උග්‍ර වෙමින් සිදු වෙමින් පවතී. එනම් මත් උවදුර නිසා සුන්දර තාරුණ්‍යය අකාලයේ මිලින වීම ය. ඉතින් මෙවර කවරයේ කතාව ආගමික මෙන් ම දේශපාලනික වශයෙන් ද මෙය මැඩලීමට කටයුතු කිරීමට ඇරයුම් කරන්නේ මෙය නිසා ඉදිරියේ දී අතිමහත් ආපදා රැසකට මුහුණ පාන්නට සිදු වීමට විශාල සම්භාවිතාවක් ඇති නිසා ම ය.

අචල රූපසිංහ

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 850.00 (මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00 (මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

**BHAKTHI PRABODHANAYA**

Rs. 850.00 for a year (Including Postage)

Rs. 1700.00 for two years (Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# ආපදාව තුළින් ක්‍රිස්තු අනුගාමිකයා

"දිට්වා" සුළි කුණාටුව නිසා විපතට පත් වූ අපගේ ම සහෝදර ජනතාවට මෙන් ම තමන්ගේ පවුල්වල ආදරණීයන් අහිමි වූ සියලු දෙනාට ම සාතිශය සංවේගය පළ කරමු. කෙටි කාලයක් තුළ දැවැන්ත ව්‍යසනයක් ඇති කරන දෙයක් එම ප්‍රදේශය තුළ කළමනාකරණය කරගන්නට අපොහොසත් වී ඇති විටක ඒ සඳහා ආධාර, අනුබල අත්‍යවශ්‍ය නම්, එය ආපදාවක් ලෙස හඳුනා ගත හැකි ය. අද ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලට එවැනි තත්ත්වයක් උදා විය.

ඒ අනුව පසුගිය නොවැම්බර් මාසයේ අවසාන දිනවල ඇති වූ "දිට්වා" සුළි කුණාටුව ආකාර ගණනාවකින් ආපදාවක් බවට පත් විය. අවපීඩන අවපාතයක් නිසා සුළි කුණාටුවක් නිර්මාණය විය. මේ සුළි කුණාටුව නිසා මිලිමීටර් 350-400 අතර ධාරානිපාත වර්ෂාවක් ලංකාවේ බොහෝ ප්‍රදේශවලට ලැබුණි. ඒ නිසා ජලාශ, වැව්, ගංගාවලට ලැබුණු වර්ෂාපතනයේ ධාරිතාව රඳවා ගැනීමට හැකියාවක් නොමැති නිසා ජල කඳ ගංගාවලින් දෙගොඩ තලා ගලන්නට විය. එමෙන් ම චණ්ඩ මාරුතය නිසා විනාශයන් ගණනාවක් සිදු විය. ගස් කඩා වැටීම, ජල ගැලීම, නාය යාම, ගොඩනැගිලි, කණු කඩා වැටීම, සන්නිවේදන පද්ධතිය බිඳ වැටීම, ජීවිත අහිමි වීම, ජීවිතවලට අනතුරු ඇති වීම, පුද්ගලයන් අතුරුදහන් වීම, තම නිවෙස් අහිමි වීම, විදුලිය ඇණ හිටීම ආදි විවිධාකාර බලපෑම්වලට මිනිසුන්ට මුහුණ දෙන්නට විය. සෑහෙන පිරිසකට තම ඇඳිවත හැරුණු විට සියල්ල අහිමි විය. තම ජීවිතය නැවත මුල සිට පටන් ගන්නට සිදු විය.

අසාමාන්‍යයෙන් ඇති වූ වර්ෂාපතනය, කුණාටුව, නායයෑම් නිසා ආපදාවේ විනාශය පවුලකට, රටකට දරන්නට බැරි තරමට ම ප්‍රමාණය ඉක්මවා ඇත. ජන ජීවිතය, ඉඳුම් හිටුම්, මාර්ග පද්ධතිය, ගොවි බිම්, ව්‍යාපාරික ස්ථාන යළි යථා තත්ත්වයට පත් කරන්නට මහා ධනස්කන්ධයක් වුවමනා ය. මෙවන් පසුබිමක දෙවියන් වහන්සේගේ හඬ කාලයේ සලකුණු හරහා අපට ඇසෙයි. ඕනෑ ම අසරණවීමක් තුළ ජනතාව පීඩා විඳින විට ඊට අත හිත දෙන්නට ක්‍රිස්තු අනුගාමිකයන්ට ක්‍රිස්තුන් වහන්සේ ආරාධනා කරන සේක. එමෙන් ම මේ ව්‍යසනය සිදු වූ විගස ඉතා ක්ෂණිකව ක්‍රියාත්මක වූ හැම කෙනෙකුගේ ම දායකත්වය තුළ දිස් වූයේ ශ්‍රී ලාංකික ජනතාවගේ මනුෂ්‍යත්වය කැපකිරීම් සහ වැය කිරීම අදටත් නාය ගොස් නැති බව ය.

එසේ පරිත්‍යාග කරන්නට අපගේ ඇඳහිල්ලේ දෙනෙත් තුළ දේව හඬට අප සුසර විය යුතු ය. අප අතිරික්තය නොව තිබෙන දේ අසරණ අය සමඟ බෙදා ගන්නට දේව වචනය කිතුනු අනුගාමිකයන්ට ආරාධනා කරයි (ලූක් 3:10-11). ක්‍රිස්තුන් වහන්සේ අසරණයන් තුළ ජීවමාන වන බව දේව වචනය තවදුරටත් පවසයි (මතෙව් 25:35-40). එබැවින් අපගේ දේවස්ථානවල පැවැත්වෙන වාර්ෂික මංගල්‍යය සහ විවිධාකාර ප්‍රිය සම්භාෂණ මේ ආදි අවස්ථාවලට වැය කරන ඇතැම් වියදම් කපා හැර මිනිසුන්ගේ ජන ජීවිත ගොඩ නගන්නට සහ වැටුණු තැනින් නැගිටුවන්නට වැය කළ හැකි නම් එය ක්‍රිස්තුන් වහන්සේගේ වචනයට අවනතව සැබැවින් ම සාක්ෂි දැරීමකි.

**"ප්‍රේමය යනු කිමෙක් දැ යි අප දන්නේ, ක්‍රිස්තුන් වහන්සේ සිය ජීවිතය අප උදෙසා පරිත්‍යාග කළ බැවිනි. අප ද, සහෝදරයන් උදෙසා අපේ ජීවිත පරිත්‍යාග කළ යුතු ය. ලෞකික සම්පත් ඇති කෙනෙක්, තම සහෝදරයාගේ අගහිඟකම දැක දැකත්, ඔහුට අනුකම්පා නොකරත් නම්, දෙවියන් වහන්සේගේ ප්‍රේමය ඔහු තුළ පවතින්නේ කෙසේ ද? මාගේ ප්‍රිය දරුවෙනි, අපගේ ප්‍රේමය වචනයෙන් වත්, කතාවෙන් වත් නොව, ක්‍රියාවෙන් ප්‍රකාශ වන සත්‍ය ප්‍රේමයක් විය යුතු ය"** (1 ජොහන් 3:16-18).

**එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා**

# මත් රසින් මත් වී

## හෙළිදරව්ව

මත් රසින් මත් වන්නට බොහෝ දෙනෙක් කැමති ය. එය ජන ජීවිතයේ අත්‍යවශ්‍ය ක්‍රියාවක් යන්න සමාජය තුළ ජන මතයක් ද ගොඩ නැඟී ඇත. විනෝද සහ වන්දනා ගමනක දී, විවාහ මංගල්‍යය සහ අවමංගල්‍යයක දී උපන් දින සාදයක් හෝ වෙන කවර ආකාරයේ එකතු වීමක දී බොහෝ අවස්ථාවල මත් වතුර භාවිතය සුලබ ය. මත් වතුරට ඇබ්බැහි වීමට වඩා අද තරුණ පරපුර සිගරට් සහ මත් කුඩුවලට ඇබ්බැහි වීම ඊටත් වඩා භයානක ය යන්න සිතෙන්නේ ඇති වී ඇති ප්‍රතිවිපාක නිසා ය. මේවාට ඇබ්බැහි වීමේ හේතු සාධක ලෙස ඔවුන් දක්වන කරුණු මෙසේ ය.

- සතුට, තෘප්තිය, සැනසීම සොයා මේවාට සමහරු ඇබ්බැහි වී ඇත.
- තමන්ට ඇති වූ ගැටලුවක් විසඳා ගැනීමට නොහැකිව ප්‍රශ්නය මඟ හරින්නට මේවා මුලින් ම ගත් බව තවත් සමහරු පවසති.
- මිතුරන්ගේ බල කිරීම නිසා ඊට පිවිසුණ බව ද ඇතැම් අය පවසති.
- තනිකම, පාළුව, අසහනකාරී තත්ත්වයන්ට පිළිතුරක් ලෙස මීට අවතීර්ණ වූ අය ද සිටිති.
- ඉන්න ටික කාලයේ දී කාලා බීලා මළත් මොක ද යන්න සිතන්නෝ ද ඇත.
- ජීවිතයට බලපාන කිසියම් අර්බුදයක දී ඊට පිළියමක් ලෙස සමහරු මෙය තෝරා ගනිති.

කවුරු කුමන අයුරින් සාධාරණීකරණය කළත් මත් රසයට ඇබ්බැහි වීම නිසා ඇති වන අහිතකර තත්ත්වයන් අනුවේදනීය ය.

- ශාරීරික සහ මානසික සෞඛ්‍යය පිරිහේ.
- බාහිර පෙනුම ද ක්‍රම ක්‍රමයෙන් විරූපි වන අයුරු දැක ගත හැකි ය.
- ආර්ථිකය පිරිහේ. පවුලක් ජීවත් කරවන්නට අත්‍යවශ්‍ය මුදල් අහිමි වේ.
- සාමාජීය ජීවිතය පිරිහේ. ඇතැම් අවස්ථාවල පුද්ගලයාගේ හැසිරීම ඉතා අශීලාචාර ය, ආදර්ශයක් නැති තරම් ය.
- ආධ්‍යාත්මිකව පිරිහේ. දිව්‍ය පූජාවට සහභාගි වීමට, යාච්ඤා කරන්නට මනාපයක් නැත.

**තාරුණ්‍යය අනතුරේ**

තරුණ පරපුර ඕනෑ ම පවුලක, රටක, සමාජයක අනාගතය යි. එහෙත් අද සෑහෙන තරුණ පිරිසක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී ඇත. පළමුව මේ අය ඇබ්බැහි වන්නේ මිතුරන්ගේ බලපෑම නිසා යයි අපට ඇසේ. ඇත්තෙන් ම මේ කියන අය 'සැබෑ මිතුරෝ' ද යන්න වෙනම ම කථා කළ යුතු ය. තරුණයන්ගේ බුද්ධිමය වර්ධනය, අධ්‍යාපනික ජීවිතය, ආත්ම විශ්වාසය, විනය සහ දහම් දිවිය මත්ද්‍රව්‍ය මඟින් විනාශ කරයි. මත්ද්‍රව්‍ය භාවිත කරන තරුණයෙක් තමන්ගේ ජීවිත අරමුණු, ඉලක්ක නොසලකා හැර, සමාජයේ පිළිගත් ශිෂ්ටසම්පන්න ජීවිතයට, නීතිරීතිවලට ගරු කිරීමේ වුවමනාව අත් හැර දමයි. මත්ද්‍රව්‍ය භාවිත කරන්නෝ සිත පාලනය කිරීමේ හැකියාව අහිමි කර ගනිති. එමඟින් ඔවුහු යහපත සහ අයහපත අතර වෙනස නො දකිති. එබැවින් සංකීර්ණ ගැටලු ගණනාවකට ඔවුහු ගොදුරු වෙති.

මත් වතුර, සිගරට් සහ මත්ද්‍රව්‍ය සඳහා ගොදුරු වී ජීවිතය මං මුළා කරගත් උදවියට සහ ඊට අලුතින් එකතු වන්නන්ට ඉන් බැහැර වන්නට උපකාර කිරීම සමාජයේ සුවිශේෂී වගකීමකි. එය අද යුගයේ එඬේරික සහ දිවැසියේ කැඳවීමක මෙහෙවරක් ලෙස දකිමි.

**"මම යහපත් එඬේරා වෙමි"** (ජොහන් 10:11). එමෙන් ම ජේසුස් වහන්සේ මෙලොව පැමිණියේ මන්ද යන්න උන් වහන්සේ ම ප්‍රකාශ කරන සේක. **"මා පැමිණියේ මිනිසුන්ට ජීවනය ලැබෙන පිණිස ය. සපුරා ම එය ලැබෙන පිණිස ය"** (ජොහන් 10:10).

"මත් රසින්" යනු විනාශයට පත් මනෝ භාවයකි. එහෙත් දෙවියන්ගේ ප්‍රේමය හා ආත්මික ශක්තිය තුළින් පමණක් එම අඳුරු මිථ්‍යාවන් සහ මායාවන්වලින් මිදුම ලැබිය හැකි ය. සැබැවින් ම ජීවනයේ රසය, සැනසීම, සංතෘප්තිය දෙවියන් තුළ පමණක් ඇති බව සත්‍යයකි. හැම මනුෂ්‍යයකු ම දෙවියන් වහන්සේගේ ස්වරූපයට මවා ඇති බවත් ඔහු සහ ඇය ශුද්ධාත්මයාණන්ගේ මන්දිරයක් බව ද දේව වචනය ප්‍රකාශ කරයි (උත්පත්ති 1:27, 1 කොරින්ති 6:19).


වර්තමානයේ දී මත් රසින් මත් වූ ඇතැම් අය තම යහළුවන් ව, පවුලේ අය ව පවා මරා දැමූ අවස්ථා වාර්තා වී ඇත. මත්ද්‍රව්‍ය උවදුර පවුල මෙන් ම සමස්ත සමාජය ම විනාශ කරන පිළිලයකි; තර්ජනයකි; අලාභයකි. පවුලේ අයට සහ සමාජයට විශාල අලාභයක් සිදු වේ. එක්තරා නිවසකට මා ගිය මොහොතේ එම පවුලේ මව මා සමඟ පැවසුවේ "මගේ පුතා නිවසට පැමිණියොත් පියතුමෙනි, මම ඉක්මනට ම පොලීසියට කථා කරනවා. ඔහු තවදුරටත් මගේ පුතෙක් නොවෙයි. නිවසේ ඇති සියලු ම වටිනා දෑ ඔහු විකුණා ඇත". මේ උවදුර නිසා මව්පියන් ඇතුළු පවුලේ අය අසරණ වී ඇත. අසල්වාසීන්ට සැනසීමෙන් ජීවත් වන්නට හැකියාවක් නැත. ආරවුල්, අපරාධ, සොරකම්, මැරකම් දෙගුණ තෙගුණ වී ඇත. පාසල් හා විශ්වවිද්‍යාල ජීවිත අස්ථාවර කරයි. මාර්ග අනතුරුවලින් මිය යන සංඛ්‍යාව ඉහළ යන්නට ද මෙය හේතුවක් වී ඇත. මත්ද්‍රව්‍ය අලෙවි කර ලක්ෂ ගණනින් ලාභ උපයා ගන්නා අය කොපමණ මුදල් උපයා ගත්තත්, අධික සුඛෝපභෝගී ජීවිත ගත කළත්, ආගමික ස්ථානවලට එසේ උපයාගත් මුදලින් යමක් පරිත්‍යාග කළත් මතක් කර ගත යුත්තේ මිනිසුන්ගේ විශේෂයෙන් ම තරුණයන්ගේ මළ කඳන් මතින් ඔවුන් මුදල් උපයනවා යන්න ය. එවැනි ක්‍රියා හෙණ ගහන බරපතළ පාපයන් බව ඉඳුරා ම අවබෝධ කර දීම යුගයේ දිවැසියේ කාර්යයකි. මිනිසුන්ගේ ජීවිත අකර්මන්‍ය කර හෝ මරා දමා සොයන මුදල් කාබාසීනියා වීම ඉතා කෙටි කලකින් සිදු වේ. මතට ඇබ්බැහි වූවන්ගේ පවුල්වල අයගේ අඳෝනාවල්, විලාප, සුසුම් හෙළීම් මහ පොළොවට උසුලන්නට නොහැකි සාපයකි. මේ සාපය අද ශ්‍රී ලාංකික සමාජය වෙළා ගෙන ඇත.

වර්තමානයේ දේවස්ථාන ඇතුළු අනිකුත් ගොඩනැගිලි ඉදි කරන්නට විශාල ධනස්කන්ධයක් වැය කරයි. එහෙත් ශුද්ධාත්මයාණන්ගේ මන්දිර වූ මිනිස් ජීවිත අකාලයේ මිලාන කරන විට ඊට එරෙහිව දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීමට, පුනරුත්ථාපන මධ්‍යස්ථාන ඉදි කිරීමට වගකිවයුත්තන් ඊට නො දෙවෙනි මුදලක් වැය කිරීමට සූදානම් ද යන්න විමසිය යුතු ය. සුව මෙහෙයන් කරන්නට දක්වන ඉමහත් උනන්දුව මෙවැනි මත්ද්‍රව්‍යයන්ට ගොදුරු වූවන්ව ගලවා ගැනීමට හෝ පුනරුත්ථාපනය කිරීමට දූත මෙහෙවරක් ලෙස ආරම්භ කිරීම යුගයේ අත්‍යවශ්‍යතාවකි. මන්ද ක්‍රිස්තුන් වහන්සේ දුක් විඳින මංමුළා වූ ඊට ගොදුරු වූ අය අතර සිටින බවට දේව වචනය අපට අනාවරණය නො කරයි ද? විවිධාකාර ඇබ්බැහිවීම් නිසා ශාරීරික, මානසික, සමාජීය සහ ආධ්‍යාත්මික වශයෙන් ගිලන් වී අසරණ වූ හැම කෙනකු තුළ ම ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ හමුවන්නට ඇඳහිල්ලේ දෙනෙත් විවර කරමු.

**"රෝගාතුර ව සිටියෙමි, ඔබ මා බලාගත්තහු ය. හිරගෙදර සිටියෙමි. ඔබ මා බලන්න ආවහු දැ යි"** ක්‍රිස්තුන් වහන්සේ දිනක අපෙන් අසනු ඇත. **"එවිට සැබැවින් ම මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතා ම සුළු තැනැත්තාට වුව ද එසේ කළා නම් එය කළේ මට ය"** යි ක්‍රිස්තුන් වහන්සේ පවසන **සේක."** (මතෙව් 25:39-40).

**සංස්කාරක පියතුමා**

# අප කුමට ඇබ්බැහි වී ඇත්තෙමු ද?



"කනත්ත පාර වැලිගම්පිටිය ජා ඇල
ඉපදුණ තැන මගේ
අපි මංගල්ල කාලෙට
විස්කි බෝතලේට කසිප්පු දාලයි ගැහුවේ"

අර්ජුමාන් විසින් පද රචනය කර ඇති "චූටි කාලෙ අපි වැස්සේ නාන කොට" යන ගීතයේ ඉහත පද පේළි කිහිපය ශ්‍රී ලංකාවේ කතෝලිකයන් වැඩි වශයෙන් වාසය කරන ප්‍රදේශයක දේවස්ථානවල වාර්ෂික මංගල්‍යය සමයේ මත්පැන්වල අත්‍යාවශ්‍යතාව මනාව විදහා දක්වන්නකි. මෙලෙස මතට ලොල් වුණු මත් රසින් මත් වුණු කතෝලිකයන් කොපමණ සිටින්නේ ද යන්න ඔබටත් මටත් නොරහසකි. යම්කිසි දෙයකට ඇබ්බැහි වී සිටින පුද්ගලයෙකු එයින් මුදවා ගැනීම ඉතාමත් අසීරු කාර්යයකි. ඇබ්බැහිවීම වනාහි යම් කිසි තෘප්තියක්, වින්දනයක් ලබා ගැනීමේ අරමුණින් යම් කිසි දෙයකට හෝ යම් කිසි ක්‍රියාවක් නැවත නැවත කිරීමට පෙලඹීම ලෙස සරලව හඳුනාගත හැකි ය. ඒ අනුව ඇබ්බැහිවීම යනු මත්ද්‍රව්‍ය, මත්පැන් ආදියට ඇබ්බැහි වීම පමණක්ම නොවේ.

- ජංගම දූරකථනයට ඇබ්බැහි වීම
- පරිගණක ක්‍රීඩාවලට ඇබ්බැහි වීම
- ධනයට, බලයට ඇබ්බැහි වීම
- ලිංගිකත්වයට ඇබ්බැහි වීම
- විවිධ පුද්ගලයන්ට ඇබ්බැහි වීම

එවැනි තවත් අයහපත් ඇබ්බැහි වීම් වර්ග කිහිපයක් වේ. ඕනෑම දෙයක් සීමාව ඉක්මවා සිදු කිරීම ඇබ්බැහි වීම වේ. මෙම ඇබ්බැහි වීම් කොතරම් අපගේ ජීවිතය වෙළා ගෙන ඇත් ද යන්නත්, අපගේ ජීවන රටාවට කොතරම් බලපෑම් කරන්නේ ද යන්නත් අවබෝධ නො වීම විනාශයට මුල ය.

ශ්‍රී ලංකාවේ පෝය දිනයට මත්පැන් අලෙවිසැල් විවෘත නො කරන බැවින් ඊට පෙර දින කොතරම් දිග පෝලිමක් මත්පැන් අලෙවිසැල් ඉදිරිපිට අපට දක්නට ලැබේ ද? පියා මත්පැන්වලට ලොල් වීමෙන් පවුල් ප්‍රශ්න ඇති වී දුක් විඳින බිරින්දෑවරුන්, දරුවන් කොතරම් සිටින්නේ ද? මත් රසින් මත් වී අසිහියෙන් නව වසර ආරම්භ කරන පුද්ගලයන් අප අතර කොතරම් ඇත් ද? නත්තල, මංගල්‍යය, පාස්කුව සැමරීමට මත්පැන් නැතුව ම බැරි කතෝලිකයෝ කොතරම් සිටිත් ද? එමතු ද නොව අසභ්‍ය වීඩියෝ නැරඹීමට, ලිංගිකත්වයට ඇබ්බැහි වුණු තරුණ තරුණියන් කොතරම් තම අනාගතය විනාශ කර ගනී ද? දූරකථනයට, පරිගණක ක්‍රීඩාවන්ට ඇබ්බැහි වී දරුවෝ කොතරම් තම අධ්‍යාපනය කඩාකප්පල් කර ගනිත් ද? තවත් කෝණයකින් සිතා බැලුවහොත් අප ජීවිත කාලය තුළ විවිධ පුද්ගලයන්ට ඇළුම් වනවා නොවේ ද? තමා අසීමිතව ආදරය කළ ප්‍රේමවන්තිය හෝ ප්‍රේමවන්තයා සමග පැවති සම්බන්ධය පළුදු වූ විට ඇතැමුන් තම දිවි නසා ගැනීමට පෙලඹෙනුයේ මේ ඇබ්බැහි වීම නිසා නොවේ ද? ඔහු/ඇය නොමැති ජීවිතයක් නැතැයි සිතමින් තම වටිනා ජීවිතය විනාශ කර ගනුයේ ඔවුන් එතරම් තදින් ඔවුන්ට ඇලී ගැලී ඇති බැවිනි. තව ද ඇතැමුන් බලයට, ධනයට ඇබ්බැහි වී ඇත. කොතරම් සැප සම්පත් තිබුණ ද එයින් තෘප්තියට පත් නොවී තම මඩිය තර කර ගනු වස් බලයට, ධනයට කෑදරකමින් තම රටේ අනාගතය ගැන පවා නොසිතා බල ලෝභීත්වයෙන් රට පාලනය කරන ඇතැම් අධම දේශපාලනඥයන් නිසා මෙම රට වැටී ඇති අගාධය පාඨක ඔබටත්

මටත් නොරහසකි. මෙමඟින් පැහැදිලි වනුයේ අප ඇබ්බැහි වනුයේ හුදෙක් මත්ද්‍රව්‍යවලට පමණක් නොවන බව යි. ආදරයෙන්, කාමුකත්වයෙන්, ධන ලෝභීත්වයෙන්, බල ලෝභීත්වයෙන් අප මත් වී සිටින්නෙමු. එමඟින් තමාට මෙන් ම සමාජයට වන බලපෑම ද ඉතා හානිදායක විය හැක.

එසේ හෙයින් අප කළ යුත්තේ කුමක් ද? මනුෂ්‍යයන් ලෙස අප මෙලොව ජීවත් වීමේ දී අප සැමට ආදරය, ධනය, ලිංගිකත්වය ආදිය නොමැතිව ජීවත් විය නො හැකි ය. නමුත් මනසින් උසස් යැයි සලකන මිනිසුන් ලෙස කිසිදු දෙයක අන්තයට නොගොස් බුදුරජාණන් වහන්සේ පවා දේශනා කර තිබෙන මධ්‍යම ප්‍රතිපදාවෙන් ජීවත් වීම වඩාත් යෝග්‍ය මෙන් ම හිතකර ය. ශුද්ධ වූ බයිබලය දක්වන්නේ ද "අයුතු ලාභයට ගිජු වන්නා එයින් ම වැනසේ. ඔහුගේ ඉරණම එය වන බව යි" (හිතෝපදේශය 1:9). කිසිදු දෙයකට ඇබ්බැහි නොවී, කිසිදු දෙයක අන්තයට නොයා සරල ජීවන රටාවක් අනුගමනය කිරීමට නම් අප සමිඳාණන් වහන්සේගේ මඟ පෙන්වීම අනුව තම නුවණ හා තාර්කික බුද්ධිය මෙහෙයවිය යුතු ය. ඒ බව "**හුදෙක් නුඹේ ම නුවණෙහි නො පිහිටා මුළු හිතින් හිමිතුම කෙරෙහි විශ්වාසය තබන්න. හැම දෙයක දී ම සමිඳුන් සිහි කරන්න එතුමා ඔබට හරි මඟ පෙන්වනු ඇත. ඔබ මහා නැණවතෙකැයි නො සිතන්න. සමිඳුන්ට ගරුබිය පා නපුරෙන් දුරු වන්න**" (හිතෝපදේශය 3:5-7) යන ශුද්ධ වූ බයිබලීය වදන්වලින් මනාව පැහැදිලි වේ.

එසේ නම් මත්ද්‍රව්‍යයෙන් පමණක් නොව ආදරයෙන්, බලයෙන්, ධනයෙන්, කාමයෙන්, තණ්හාවෙන් පවා මත් නොවී තමාට මෙන් ම සමාජයට අයහපත් බලපෑමක් ඇති නොවන ලෙස සමිඳුන් ඉගැන්වූ දහම තුළ මෙලොව ජීවිතය ගත කරමින් මතු යම් දිනක සදාතනික ජීවිතය ළඟා කර ගැනීමට ක්‍රිස්තු අනුගාමිකයන් වන අප සැම සිහි තබා ගත යුතු ය.

**ශෙලින්ඩා සමරසිංහ**
**නීති ශිෂ්‍ය,**
**අවසන් වසර, නීති විද්‍යාලය.**



# බලයෙන් මත් වී රට විනාශ කළ උන්

බලයෙන්, ධනයෙන්, මානයෙන්, දූෂණයෙන්,
මත් වූ අධම පාලකයෝ,
අප රට, සමාජය විනාශ කළහ.
මෙත්තා, මුදිතා, කරුණා ගුණයෙන් මත් වී,
යුක්තිය, සාධාරණයෙන් මත් වී,
ඔවුහු රට කරවූවෝ නම්,
අපටත්, අපේ අනාගත දරු පරපුරටත්,
සුරපුරයක දිවි ගෙවනට,
හැකිව තිබුණා නොවේ දෝ,
එහෙත් ලෝ දහම අනුව,
විශ්වය සැමට ම,
සාධාරණය ඉටු කරන,
දිනයක් උදාවනු නියත ය.

**ලූෂන් එඩ්වඩ් පෙරේරා**
**ගෝනවල.**

# මතට තිත : සමිඳු වත



"තුරුණු හිතට මත් රකුසා කළ හදියක්"
- පුවත්පත් කාටූනයකි -

වර්තමානයේ තුරුණු ජීවිත අකාලයේ පර වී, වියළී යන්නට ප්‍රධානතම හේතුවක් ලෙස මත්පැන්, මත්ද්‍රව්‍ය බව නම් නොරහසකි. විවිධ නාමයන්ගෙන් ද, විවිධ වර්ණවලින් මෙන් ම විවිධ හැඩයන්ගෙන් ද නිම වී ඇති මත්ද්‍රව්‍ය තරුණ හිතට, තරුණ හෙටට කරන සාපරාධය තුළින් රටේ අනාගතය සුබවාදී ලෙස දැකීමට හැකි අයෙක් සිටිත් ද? මේවාට විවිධ නම් ලබා දුන්නත්, 'මත' යන පදයට වෙනස් ම අර්ථ කථනයක් ලබා දීමට හැකි බව ඔබ දැන සිටියා ද?

ම - මගේ
ත - තනිකම

කාර්යබහුල වර්තමාන ලෝකයේ, ප්‍රධාන ම අවිය මුදල යි. මෙම අවිය උපයා ගැනීමට සියලු ම දෙනා පාහේ ඔරලෝසුවේ කටුවත් සමඟ පොර බදන ආකාරය කීමට වචනත් නැති තරම් ය. කාලයට වඩා වේගයෙන් මුදල් උපයන්නට වෙර දරන සියලු දෙනා තම අසාර්ථක සැලසුම් තුළ සිර වී, තනි වී පිළිතුරක් අපේක්ෂා වනුයේ, ඉතා කඩිනම් ආකාරයෙනි. මෙයට බොහෝ දෙනා විනාශයට මඟ කියන සරල සැනසුම් මාර්ග සොයන්නේ නැද්ද?

- හිතේ දුක යැයි පවසමින් කසිප්පු මුදලාලි පොහොසත් කරනවා නොවේ ද?
- ඇගේ පතේ අමාරුවට සම්බාහන මධ්‍යස්ථානයක දොරට තට්ටු කරනවා නොවේ ද?
- දෙවිඳුන්ගෙන් ලද බිරිඳව පසෙකලා අනියම් පෙමක පැටලෙනවා නොවේ ද?
- ශුද්ධ වූ පවුලට සමාන තම පවුල් කුටුම්භය අමතක කර රැකියාවට ම මුල් තැන දෙනවා නොවේ ද?

සත්‍ය වශයෙන් ම ඔබේ 'මත' ත් මින් සුවපත් වෙනවා ද?

කිතුනු අප කුඩා කල සිට අසා තිබෙන උපමාවක් දෙස අපගේ අවධානය යොමු කරමු. එනම් 'නැති වුණු පුත්‍රයා' පිළිබඳ උපමාව. (ශු. ලූක් 15:11-32) තමන්ගෙ සතුට වෙනුවෙන් මෙම බාල පුතා තමාට අයිති වස්තුව තම පියාගෙන් ඉල්ලා සිටියේ ය. පියාගෙන් ලද වස්තුව අරපිරිමැස්මකින් තොරව, තමන්ගෙ සතුට වෙනුවෙන් යෙදවූ ඔහුට අවසානයේ වූ ඉරණම ඔබ මම හොඳින් ම දන්නා කරුණකි.

**"නොබෝ දිනකට පසු බාල පුත්‍රයා සියල්ල එකතු කොට ගෙන දුර රටකට ගොස් එහි දී දුරාචාරයෙහි යෙදෙමින් තමාගේ සම්පත නාස්ති කර දැම්මේ ය"** (ශු. ලූක් 15:13).

වර්තමානයේ බොහෝ දෙනා ද නැති වුණු පුත්‍රයාගේ චරිතයට පණ පොවන්නේ නැද්ද?

- තමන්ගෙ පවුලෙන් නොලැබෙන ආදරය සොයා අනියම් පෙමක උරුමකරුවන්,
- පවුල් කිහිපයක නඩත්තු වියදම් දරන ස්වාමි පුරුෂයන්,
- තම ස්වාමි පුරුෂයාගේ වැරදි පවසමින් අනාචාරයේ යෙදෙන බිරින්දෑවරුන්,

මෙලෙස සිදු කිරීම තුළින් 'මත' නොහොත් 'මගේ තනිකමට' පිළිතුරක් ලැබේ ද? ඔබ මම ඉදිරියේ ප්‍රශ්නාර්ථයකි. 'මත' ට පිළිතුරු සෙවීමට ගොස් සිදු වන්නේ තව තවත් තනිකම උග්‍ර වීම නොවේ ද? සත්‍ය වශයෙන් ම 'මගේ තනිකමට'

පිළිතුර කුමක් ද? මා එය සෙවිය යුත්තේ කෙසේ ද? මේ පිළිබඳව විමසුමට ලක් කළ යුතු ම ය.

නැති වුණු පුත්‍රයා, තනිකම තුළ මංමුළාව ගොස් සිටිය දී ඔහුගේ සිතට නැඟුණු ආදරණීය හැඟීම "මගේ තාත්තා" යන්න ය. තමන්ගේ ආදරණීය පියාණන් තම බාල පුතා නැවත පැමිණෙන තුරු බලා සිටින්නේ යම් සේ ද, අපගේ ආදරණීය දෙවි මහෝත්තමයාණන් ද මග බලා සිටිනුයේ, තම පව්කමින් ඈත් ව, ඔවුන් වහන්සේගේ ආදරණීය තුරුලට ළං වන තුරු ය.

- පවුලෙන් ඈත් වෙනවා වෙනුවට පවුලක් ලෙස එකට ජපමාලය කියමු.
- පවුලේ ප්‍රශ්න පවුල තුළ ම විසඳා ගනිමු.
- දූරකථනය සමග ගන්නා ආහාර වේල වෙනුවට පවුලක් ලෙස කෑම මේසයක වාඩි වෙමු.
- ඇස් දෙකින් වැරදි දකිනවා වෙනුවට හොඳ දකින්න උත්සාහ කරමු.
- දූරකථනය වෙනුවට ජපමාලය අතට ගනිමු.
- ඉරුදින දිව්‍ය පූජාවකින් සතිය පටන් ගනිමු.

'මත' ට (මගේ තනිකමට) තිත තියන්නට නම් දෙවිඳුන්ගේ වත දැකිය යුතු බව මතක තබා ගත යුතු කරුණකි. "මුද්‍රික පානයෙන් මත් නොවන්න. එයින් අනාචාරකම් හට ගන්නේ ය. ඒ වෙනුවට ආත්මයාණන්ගෙන් පූර්ණ වන්න" (එපීස 5:18). තනිකමට පිළිතුර මත්පැන්, මත්ද්‍රව්‍ය යැයි සිතන බොහෝ දෙනා වර්තමානයේ ඒවා ප්‍රයෝජනයට ගන්නේ ඔවුන්වත් නොදන්නා අඳුරු අනාගතයකට ඔවුන් විසින් ම ඔවුන්ව ඇද දමා ගනිමිනි. තරුණ ප්‍රජාව යනු රටක අනාගත භාරකරුවන් ය. රටක අනාගතය වර්තමානයේ අමු අමුවේ කා දැමීම රටේ පරිහානියට ප්‍රධාන කරුණකි.

- අතීතයේ දාම් අතක් ගැසූ කොල්ලෝ කුරුට්ටෝ දූරකථනයෙන් වෙඩි තබා ගන්නා කාලය යි.
- ආදර සිතුවිලි කවි කෙරූ අතීත කොල්ලෝ වර්තමානයේ තොණ්ඩුවෙන් විසඳුම් සොයන කාලය යි.
- පැන පැන්සල කනේ ගසා සිටි කොලු පැටවුන්ගේ ඉණේ කිනිසි රැඳෙන කාලය

මෙයට හේතුව නම් කිමෙක් ද? මත් රකුසාට තරුණ ජීවිත අමු අමුවේ බිලි වීම නොවේ ද?

- වැරදි මිතුරු ඇසුර
- අනවශ්‍ය පුද්ගලික මෙන් ම ලිංගික සම්බන්ධතා

වැනි කරුණුවල පහස ලැබීමේ අග්‍ර ප්‍රතිඵලය මත්ද්‍රව්‍ය, මත්පැන්වලට නිරායාසයෙන් ම හුරු වීම යි. මෙයින් තරුණ ජීවිත ගලවා ගන්නට කිසිවෙකුට නොහැකි ද?

"ගීතිකා, තුති ගී හා ශුද්ධ ගීතිකා එකිනෙකාට ගයන්න. ඔබ හදවත් තුළ තුති නද දෙමින් සමිඳුන්ට ගී ගයන්න. අපගේ සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් දෙවි පියාණන් වහන්සේට සෑම විට ම සෑම දේ ගැන ම ස්තුති කරන්න" (එපීස 5:19-20)

- දෙවිඳුන් දුන් දෙනෙතින් යහපත නරඹන්න.
- දෙවිඳුන් දුන් මනසින් ලොවක් සුවපත් කරන්න සිතන්න.
- දෙවිඳුන් දුන් මුඛයෙන් පසස් ගී ගයන්න.
- දෙවිඳුන් දුන් හදින් ලොවට ආදරේ බෙදන්න.

තරුණ තරුණයිනි, ඔබ ගේ කුරුල්ලන් දහසකට වඩා ඔවුන් වහන්සේට වටිනා බව මතක තබා ගන්න. ඔබේ වටිනා ජීවිතය 'මගේ තනිකම' - 'මත' තුළ සිර නොකොට තවත් සිත් සතන් සනසන්නට පෙරට එන්න.

'මගේ තනිකම' තුළ සිර නොවුණු, ලොවට එළිය බෙදන දහම් දූත දූතිකාවන් වන්නට උන්වහන්සේ ඔබට මට ආරාධනා කරන සේක. එය පිළිගැනීම මෙන් ම නො පිළිගැනීම ඔබේ මගේ වගකීමකි.

- මතට තිත තබන්නට නම් සමිඳු වත දැකිය යුතු ම ය. -

බුද්ධික සඳරුවන්
ශා. අන්තෝනි සිද්ධස්ථානය, දළුපත.

# මත් (නි) සෙන් මිදෙමු?



එකල කිර්ගිස්ථානයේ කඳුකර පළාතක
සීතලට හිරි වැටෙන
අසිරු වූ දේශගුණයක පාසලක සිසු කැලට
සිප් සතර කියා දුන්
ගුරුතුමිය 'ඉන්කමාල් අපායි'
මට ද හමු වුණා
'වේලාසන කොක්කු ඇවිත්'
නම් වූ අපූර්ව කෘතිය තුළ

ඇය කියා දුන් අපූරුව
එදා තිබූ අපෙ මව්බිම ගැන
"වැදගත් ම දෙය තමයි
ශ්‍රී ලංකාව උණුසුම් රටක් වීම
සීතලේ ගැහෙන්නේ නැතිව
ජීවත් වීමට හැකි වීම ..."

අනේ ! ඉන්කමාල් අපායි
අද නුඹ සිටියා නම්
මේ දේශයේ අසිරිය ගැන
'උණුසුමේ' සැනසීම ගැන
කියාවි ද කොහොම?
අද ගැහෙන්නේ අපි බියට ...
නිරන්තරයෙන් ඇසෙන වෙඩි හඬට
තොග ගණනින් මතු වෙනා
අමුතු නම් ඇති මත්ද්‍රව්‍යවලට
භීෂණයෙ අන්ධකාරයට !

අනෙ, අපේ මව් රටට
'වේලාසන ම ඇවිත් - කොක්කු' නොව
අමුතුම ...ක්කු
මෙරට කරවා උඩු - යටිකුරු
රිදුවමින් යහ දන සිත්
වනසමින් යෞවනය
විකල් කරවා දරු ගත් සිත්
උණුසුම් නොව - උණු කරවා මා පිය හදවත්
බෙදමින් වපුරනා අයුරු
අමනුෂ්‍යයන් මවන මත් (නි) රස

මතකයට එයි ඉන්කමාල්
ඔබෙ තවත් මිහිරි වදන් පෙළක්
"ඉන්දියාව ලෙස නම් ලද
කිරි බුරුල්ලෙන් වැටුණ (වැහෙන)
කිරි බිඳුවක් වගෙයි ශ්‍රී ලංකාව"
එහෙත් අද - කිරි නොවේ
වැහෙන්නෙ බිඳු ම යි කඳුළු

සුදු පිරුවටවලින් වැසුණු
නෙරා ගිය උදර ඇත්තන් ...
අවි හරඹ පාන්නට
යහමින් ධනය උපදවන්නන්
මත් (නි) රස ජාවාරමෙන් ...
අපායේ මුවවිටට ඇද දමමින් දේශය
කරනා විකුමන් (උන් සිතනා ලෙස)
නවතින්නේ කවදා ද?

බලා සිටින්නෙමු අපි
බලාපොරොත්තුවේ දැස් දල්වා
රට නිසි ලෙස කරවන්නට
අප ම භාර දුන්
බලවතුන් දෙස !

නීටා අයි. ප්‍රනාන්දු

# මත, ලොල් වීම සහ ඉන් මිදීම

එදා රෝමයේ මිදී යුෂත් ආසියානු කලාපයේ තල් හා පොල් ආශ්‍රිතව වූ මල් පැණිවලිනුත් මත්වීම අද ඉතා දියුණු අනුක රසායන ද්‍රව්‍ය බවට පත් ව, එදා මෙන් ම අදත් මිනිසුන් මත් කරයි.

ආහාර, විවිධ ජාන හා මෙම මත්ද්‍රව්‍ය ද රසායන ද්‍රව්‍ය වෙයි. කෙනෙක් ආහාරවලට ගිජු වී, වැඩිපුර ගිල දැමූ විට මහත් වී විවිධ වූ ලෙඩ රෝගවලට ගොදුරු වෙති. එය ද ඇබ්බැහියකි.

ලංකාවේ දී, මත්ද්‍රව්‍ය රජයේ අවසර ඇතිව රජයට බදු ගෙවා පොදු ජනතාවට මිල දී ගත හැකි අතර ඒවා පානය කර අක්මාව තුළ සිරෝසිස් ඇතුළු විවිධ ලෙඩ රෝග සෑදුණු අය ඕනෑ ම පළාත්බද රෝහලක වෛද්‍ය වාට්ටුවල අවසාන ඇඳන් කොටසේ උදරය විසල් වී වැතිර සිටිනු විමසිලිවන්ත ඕනෑ ම කෙනකුට දැක ගත හැකි ය.

තව ද රජයේ අවසර ලත් තැබෑරුම් මෙන් නොව ඕනෑ ම ගමක සමහර විට පොලිසිය පවා දැනුවත්ව හොර අරක්කු තිප්පොළක් බොහෝ විට දක්නට ඇත. අප දිවි ගෙවන මිනුවන්ගොඩ ගම් පළාතේ පවා අවුරුදු හතළිහකට වඩා අප හොඳින් දන්නා ගම්වැසියෙකු ඉතා ප්‍රසිද්ධියේ මෙම ව්‍යාපාරය කරගෙන යන අතර පොලිසියට අසුවීමට අවශ්‍ය වූ විට ඔහුගේ ගෝලයෙක් ඊට සූදානමින් සිටියි. එම ගෝලයන් ඕනෑ ම නෛතික දඬුවමක් මුදලට විඳීමට සූදානම් ය. මෙම පුද්ගලයා රජයට බදු නොගෙවන අතර අනීතික ලෙස සමහර ඇත්තන්ට සන්තෝසම් ලබාදෙයි.

මේ ළඟ දී ඔහුගේ පැමිණිල්ල වූයේ ගම තුළ වේගයෙන් ව්‍යාප්ත වූ කුඩු හා ගංජා ව්‍යාපාරය නිසා ඔහුගේ ව්‍යාපාර අඩපණ වී ඇති බවයි. ඔහු හා ඒ පවුල පෙර දී හොර අරක්කු ව්‍යාපාරය අනීතික ලෙස රජකළ අතර මෝටර් බයිසිකල්, රත්තරන් ආදිය මත් ලෝලීන් විකුණුවේ මොහුට ය. නමුත් අද තත්ත්වය වෙනස් වී ඇත. එකල අහල ගම් හතක සෑම දේශපාලන රැස්වීමකට ම අනලස් ව කසිප්පු සපයා අනීතික ලයිසම ඔහු සතුකර ගත් අතර එකල දිවයිනේ පොදු ක්‍රමවේදය වූයේ ද එය යි.

පසුව මේ කසිප්පු නිෂ්පාදකයා හා අලෙවිකරුවන් එකතු වී බලධාරීන්ගෙන් සමහරක් සමඟ ඉතා විධිමත් අයුරින් සහයෝග යෙන් මෙය සිදු කළ අතර අද එම ව්‍යාපාරය අභියෝග රැසකට මුහුණ දී ඇත. කසිප්පු හා අරක්කු පානය කරන ගැනුම්කරුවන් දශකයක් හෝ දෙකක් හෝ ඉක්මවා ඉන්නා අතර අද ඇති අන් මත්ද්‍රව්‍ය පරිහරණය කරන තරුණ පිරිස තමන්ගේ තෙවන දශක ආශ්‍රිතව සමුගනිති; හෝ සමු ගැනීමට නියමිත වෙයි. ලංකාවේ දේශපාලනය තුළ 1977න් පසු පාතාල සාධකය දියුණු වූ අතර සමහර රට කරවන්නන් නම ගිය අපරාධකරුවන්ට දිවයිනට ම සාමදාන විනිශ්චයකාර පදවි දුන් බව අප කවුරුත් දන්නා කරුණකි. මෙය 88 - 89 දී තීව්‍ර වූ අතර නීතිය වල් වදින තැනට කටයුතු සිදු විය. ඉන්පසු ඝාතන රැල්ල අඩු වුවත් රටේ පිළිකා ඇතුළු බෝ නොවන රෝග ද, තහනම් මත්ද්‍රව්‍ය ලෙස හෙරොයින්, මරිජුවානා, අයිස්, මෙත් ඇම්පිටමයින්, ඩාන්සින් පිල්ස්, ඇපල් පිල්ස්, විද්‍යුත් සිගරැට්, විද්‍යුත් ගංජා පැණි රස හා විවිධ රසැති මත්ද්‍රව්‍ය කරළියට පැමිණි අතර ගමේ ගොඩේ කසිප්පු පෙරීමට භාවිත කළ භාගික ආසවනය නැමැති උසස් පෙළ රසායන විද්‍යාව විෂය නිර්දේශයේ අන්තර්ගත පාඩමක සඳහන් වන කෘතිම මූලද්‍රව්‍ය මුසුකර මිනිසුන්ගේ අගතියට යොදා ගෙන ඇත.

13 වන පිටුවට ...

වෛද්‍ය සචිත මෙන්ඩිස්

# මතින් තොර නිදහස් රටක්



සිංහල ජාතිය ගෞරවාන්විත ශක්තිමත් දිවි පෙවෙතක් අතීතයේ ගත කළහ. ඒ පිළිබඳව වැඩිහිටියන් කතාන්දර ලෙස අපට කුඩා කාලයේ පවසා ඇත. වර්තමානයේ තාක්ෂණයේ දියුණුවත් සමඟ ම අප මව්බිම විදේශ රටවල් සේ ම සංවර්ධනය වෙමින් පවතී. භාණ්ඩ අපනයනය හා ආනයනය කිරීම තුළින් මෙරට තිබෙන දේ විදේශ රටවලටත්, එහි ඇති දෑ අප රටටත් ගෙන ඒමට හැකියාව ඇති අතර දැන් සමාජය තුළ වෛරසයක් ලෙස පැතිරී යන මත්ද්‍රව්‍ය, ඒ ආකාරයට මෙරටට පැමිණි දේවල් වේ.

අතීතයේ ජනයා පොල් / කිතුල් රා බී, බුලත් විටත් කා, කළු / හඳුන් සුරුට්ටු වැනි ද්‍රව්‍ය භාවිතයෙන් යම් ආකාරයට මත් වූ නමුත් අද සමාජය මෙන් මත් රසයට / මත් වීමට ලොල් නොවී ය. වර්තමානයේ නවීන පන්නයේ වයින් වර්ග, අරක්කු වර්ග, සිගරට් / බීඩී සහ අයිස් වැනි නොයෙක් නොයෙක් මත්ද්‍රව්‍යයන් දැකගන්නට ඇත. ඒවා භාවිතයට ගන්නා අය ද බොහෝ සිටිති. අද සමාජය තුළ බාල, මහලු, වැඩිහිටි, ස්ත්‍රී හා පුරුෂ භේද නොතකා මෙම මත්ද්‍රව්‍ය උවදුර ලංකාව පුරා පැතිර ගොස් ඇත.

මෙලෙස මත්ද්‍රව්‍ය අධික ලෙස භාවිතයට ගැනීමෙන් මනස විකෘති වීම, පිළිකා ඇති වීම වැනි දරුණු රෝගාබාධ ඇති වේ. ඒ පිළිබඳව අපි හොඳ හැටි දනිමු. නමුත් මෙම අඥාන මිනිස්සු "දුම්බීම පිළිකා ඇති කරයි". ලෙසට පෙට්ටියේ ලියා තිබියදීත් එය නොපෙනෙන අන්ධයන් මෙන් දුම්පානය කරති. හත් අවුරුද්දක් පිපාසයෙන් සිටින බල්ලෙකු වතුරට ඇති කැදරකමින් වතුර බීගෙන බීගෙන යන්නේ යම් සේ ද බොහෝ මිනිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී ඇත්තේ ඒ ආකාරයට ය. ඇතැම් අය මිතුරන් සමඟ හොඳට මත් වී නොහොබිනා වැඩවල යෙදෙති. දැන් සමාජය තුළ සිදු වන අපරාධවලට ප්‍රධාන හේතුව මත්ද්‍රව්‍යවලට, මත්පැන්වලට ලොල් වීම යි. ඒ වගේ ම ඇතැම්හු තම නිවැසියන් හට දරුණු ලෙසට වද හිංසා කරති.

බිරිඳක් කියන්නේ ම, අවදි වූ වෙලාවේ සිට විවිධ වූ කාර්යයන්වල නිරත වන්නෙකි. ඉතින් ඔවුන් ඔවුන්ට ලැබෙන කෙටි කාලයක වුවත් සැනසීමෙන්, සතුටින් හා පිරිසිදුව කාලය ගත කිරීමට කැමති නමුත් මත් වී පැමිණෙන බේබදු මිනිසා දුටු සැණින් හා ඔහු ළඟින් එන දුගඳින් ඇය මහත් ලෙස කනගාටුවට හෝ දුකට පත් වන ආකාරය පිළිබඳවත්, දරුවන් හා තම භාර්යාවන් අතර ඇති කර ගන්නා රණ්ඩු සරුවල් නිසා දරු / දැරියන් පාසලෙනුත්, බිරින්දෑවරු සමාජයෙනුත් ලබන අපහාස සහ ඔවුන්ට කරන නින්දාවලට ඔවුන් මුහුණ දෙන ආකාරය පිළිබඳවත් මත් රසින් මත් වීමට වඩාත් ප්‍රිය කරන්නන් සිතිය යුතු ම පැනයකි.

ඉතින්, ඉහත කී පරිදි අද සමාජයේ ළමයින් අතර ද, පාසැල් තුළ ද මෙම මත්ද්‍රව්‍ය විවිධ ආකාරයෙන් බොහෝ සේ ප්‍රචලිත වී පවතින අතර, නීතියට බිය නොමැතිකම නිසා මත් උවදුරට තිත තැබීමට නොහැකි වී ඇති අතර බොහෝ ළමයින් දූෂණය වැනි අපරාධවලටත්, පිළිකා, මානසික ලෙඩවලටත් ගොදුරු වීමේ ප්‍රවණතාව අද සමාජයේ ඉතාමත් ඉහළ තත්ත්වයක් පවතී. බේබදු බව පුරුෂයින්ටත්, ස්ත්‍රීන්ටත් නුසුදුසු ය.

අප සියලු දෙනා ම මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතය අවම කර ගැනීමට කටයුතු කළ යුතු ය.

“ඕනෑ ම දෙයක් ඕනෑවට වැඩිය ඕනෑ ම නෑ” යන කියමන අද සමාජයට බෙහෙවින් ම වටින කියමනකි. අකාලයේ තම ජීවිතය නැති කරගන්නේ නැතිව, ඇබ්බැහි වීම් නිසා අන් අයගේ ජීවිත ද නැති කර ගන්නේ නැතිව යහපත් දිවියක් ගත කිරීමටත් සමාජයට වැඩදායී, යහපත් පුරවැසියෙක් වීමටත් මතින් තොර නිදහස් රටක් බිහි කිරීමටත් අප උත්සාහ කරමු.

**මත, ලොල් වීම සහ ඉන් මිදීම**
**11 වන පිටුවෙන් ...**

එදා ඉහළ පෙළේ රසායන විද්‍යාත්මක මත්ද්‍රව්‍ය අද ඉතා සුලබව පැවතීම මේවා බෙදා හැරීම නිෂ්පාදනය, ඉතාමත් සූක්ෂ්ම ලෙස නතර කිරීම ජාතියේ අංක එකේ අවශ්‍යතාවක් ලෙස මම දකිමි. අද අධ්‍යාපන මනෝ විද්‍යාව හා විද්‍යාව ඉතා දියුණු අතර, මත්ද්‍රව්‍ය ඇබ්බැහිය ඉතා තාක්ෂණය අනුකූලව කළ හැකි ය. පළාත්බද, නගරබද රජයේ රෝහල් සෑම ඒකකයක ම වාගේ වෛද්‍ය විශේෂඥයන් මේ සඳහා ඇති අතර කතෝලික සභාව ද මේ සඳහා විශේෂ මධ්‍යස්ථාන රට පුරා පවත්වා ගෙන යයි. අරක්කු හෝ යම් මත්ද්‍රව්‍යවලට ඔබ පවුලේ කෙනෙකු ඇබ්බැහි වී ඇත්නම් ළඟ ම ඇති රෝහලක මනෝ වෛද්‍ය ඒකකයට යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

තවද මේවා ඇබ්බැහි වීමට ප්‍රථම ව ඉතා ක්‍රමවත් අධ්‍යාපන නිර්දේශ හා නීති රාමුව ශක්තිමත් කිරීම අතිශය වැදගත් වෙයි. තවද සාතන්ට අයත් මේ මත්ද්‍රව්‍ය මඳ පමණින් හෝ හොඳ නැත. ඉන් මිදීමට ඔබට දෙවියන් දුන් නිදහස් කැමැත්ත නැවත දෙවියන්ට ම දී මේ කෙටි ජීවිත ගමන දෙවියන්ට සුපසන් ව ගත කිරීමට ඔබට වගකීමක් ඇත.

මත් රසින් මත් වී
කිම ද නුඹගේ සොබනා
අකාලේ මියැදීමට
ඇයි ද මෙතරම් ආසා...

**ජේ. කේ. සඳුනි වාසනා පින්තු**
**12 ශ්‍රේණිය,**
**ශු. ප. බාලිකා මහා විදුහල, වෙන්නප්පුව.**

# රසින් රස මත් වී

මඟුලට අවමඟුලට සහ දානයට
සතුටට දුකට හිතවත්කම බෙදන්නට
අවුල් මනසකින් සැම දෙය දකින්නට
මත් රසින් මත් වීම පමණකි එක සතුට

පැමිණෙන විට දි සැමියා පදමට මත් වී
දරු පැටවුන් වෙව්ලති දොර මුල්ලට වී
සුසුම් හෙළන බිරියන් දෙවියනට යදී
කවදා සැනසෙම් ද මේ වියවුලෙන් මිදී

මත් රකුසා සාතන් ලෙස ගෙට පැමිණෙයි
පවුල් අවුල් ඇති කරනට මාන බලයි
ඉවසුම් නොමැති තැන අවි ආයුධ පෙරට ම එයි
රස මත අවසන ඇත්තේ විනාශය යි

ජේසු අපට දුන්නේ සගලොව රසය යි
සිරි රුහිරයත් දෙව් සිරිකයත් පූපය සහ මිදි රසය යි
කල්වාරියෙහි බිලි පඬුරෙන් ලැබූ සුවය යි
දෙව් පුද යාගයෙන් එන වචනය සහ දිව බොඳුන යි

මතින් තොර වූ ලස්සන ලෝකයක් සදන්නට
මතු පරපුරට නිසි මඟ නිසි ලෙස තනන්නට
සුසුදු සිතින් දරුවන් දෙස බලන්නට
සුදතුම් වරම් දෙනු මැන අප නායකයන්ට

**අයිරින් කොස්තා**
**කඳවල.**

# මත් රසේ සාතන්ලා

සුදු පුතේ මොකද මේ අද වෙන ද වගෙ නෙමේ
ඇස් දෙකත් රතු වෙලා ඇඟට පණ නෑ වගේ
නිදි මතේ වගෙ වැනෙන නුඹට මොනව ද වුණේ
මේස පුටු පෙරලා කඩා ජනෙල් වීදුරු බින්දෙ
දහදිය පෙරාගෙන වෛරයෙන් කෑ ගැහුවේ
කෑම සීතල වෙලා ඇයි තාම කෑවෙ නැත්තෙ
ඊයෙ රෑ නුඹ නැතුව නිදි මැරුව මුළු රැය ම
ගැරේජ් එකේ වැඩ කරලා මුළු පඩිය මට දීලා
නුඹේ උවමනාවටත් මගෙන් ඉල්ලුවේ මුදල්
ඒත් දැන් දැන් පුතේ සතයක්වත් මට නො දී
මගෙන් ඉල්ලන්නෙ සල්ලි. මොනවාද නුඹට වුණේ
රෑ මුර වැඩ කරල තාත්තා මට දෙන මුදල
අපේ බඩගින්නටයි වැය වෙන්නේ හැමදා ම
ඒත් මම කොහොම හරි කන්ඩ උයල දෙනවනේ
සල්ලි ම ඉල්ලමින් කෑ ගහලා මට බැණලා
ගහන්නත් ගියෙ ඇයි ද මොකද මේ උඹට වුණේ
කියාපන් මගෙ පුතේ කෝ පෙර බැඳි සෙනේ
ලෙංගතුවේ ආදරේ. අම්මා අප්පා නාඳුනන තරමට
නුඹ වෙනස් උනේ කොහොම. මත් රසින් මත් වෙලා
පුතු පිස්සෙක් වෙලා මත් රසින් උපන් පුතු සාතන් වෙලා
ඉර හඳ තරු ඉල්ලුවත් අපි ගෙනල්ලා දෙනවා පුත
මුළු ලොව ම ඉල්ලුවත් ගෙනත් දෙනවා පුත
ඒත් මත් කුඩට නම් සල්ලි දෙන්නෙ නැහැ පුතේ
ගේ කඩා ඉහිරුවත් බැන්නත් ගැහුවත් මාව මැරුවත් පුතේ
මත් කුඩට සල්ලි නම් මම දෙන්නේ නැහැ පුතේ
ඒ මම නුඹට ආදරේ හින්දමයි මගෙ පුතේ
සාතන්ගේ අඩවියෙන් බිමට බැහැපන් සුදු පුතේ

**අයිරාංගනී ලියනගේ**
**පමුණුගම.**

# "භක්ති ප්‍රබෝධනය" සංස්කාරක මණ්ඩලයේ රූපස් ප්‍රැන්සිස් මහතා දෙව්මිණ සම්මානයෙන් පිදුම් ලබයි !




හලාවත රදගුරු පදවිය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන, එම පදවියේ නිල පුවත්පත වන "දෙව්මිණ" පුවත්පත ආරම්භ කොට වසර දහයක් සපිරීම නිමිත්තෙන් එම පුවත්පතට ලිපි හා විශේෂාංග සපයන ලේඛක ලේඛිකාවන්ට උපහාර සම්මාන පිරිනැමීමක් පසුගිය දා වෙන්නප්පුවේ දී සිදු විය.

මෙහි දී එම පුවත්පතේ විශේෂාංග ලේඛකයෙකු ලෙස දිගු කලක සිට කටයුතු කරන, 'භක්ති ප්‍රබෝධනය' සංස්කාරක මණ්ඩලයේ රූපස් ප්‍රැන්සිස් මහතා ද උපහාර සම්මානයෙන් පිදුම් ලැබී ය.

රූපස් ප්‍රැන්සිස් මහතාට 'භක්ති ප්‍රබෝධනය' සංස්කාරක පියතුමන් ඇතුළු සංස්කාරක මණ්ඩලයේ සුබ පැතුම් !

සටහන - ටී. සුනිල් ප්‍රනාන්දු

# සුන්දර සඳ හංගන වලාකුළු...

තාත්තේ,
මහන්සි වෙලා ඔයා ගෙදර එද්දි,
ඔයාව වැලඳ ගන්න මං හරි ආසයි.
හැබැයි ඔයත් එක්ක ම,
ගෙට රිංගන මත් ගඳ,
උහුලන්න හරි අමාරුයි.
මට ඒක දැනෙන්නෙ,
පායනකම් බලන් හිටපු හඳ,
කළු වලාකුළක් ඇවිත් වසා ගත්ත වගෙයි.
අම්මගෙ ඇස් දෙකේ කඳුළු පිරිලා,
ඇය ගොඩක් මහන්සි වෙනවා,
මං දැක්කා ඇගේ අත් වෙව්ලනවත්.
සුද්ද යි පොඩ්ඩි යි කාමරයට දිව්වා,
මොන මොනවදෝ දොඩවනවා,
මට පොඩ්ඩක් ඇහුණා සුද්දි අඬනව වගේ,
දැන්නම් ඒකිට කල වයස.
දවස ම මහන්සි වෙලා හොයන සල්ලි,
ඇයි තාත්තෙ බෝතලයකට යට කරන්නේ?
ඇයි අපෙ බලාපොරොත්තු වතුරේ ගිල්ලන්නේ?
සරසවි යන්න මං හීන මැව්වා,
'සරසවි ඕන නෑ කොලුවෝ,
අපි පොඩ්ඩිට උගන්නමු'
මං මගෙ හීනෙ යට ගැහුවා.
හිතට නම් ටිකක් දුකයි.
කමක් නෑ තාත්තේ.
හැබැයි ලබන මාසෙ පොඩ්ඩිගේ විභාගෙ.
ඒකි පාඩම් කරනවා නෙමේ,
කාමරේට වෙලා අඬනවා.
අපි පොඩ්ඩිටවත් ඉගෙන ගන්න දෙමු තාත්තේ.
අපි දුප්පත් නෑ, අපව දුප්පත් කරලා.
අපට ඕනේ ඔයාව,
බෝතලය නෙමෙයි, තාත්තව.

ගරු කීර්ති සඳරුවන් ප්‍රනාන්දු නි.ම.නි. සහෝදරතුමා,
ජාතික දෙව්සත්හල, අම්පිටිය.

# මත් රසින් ඈත් විය... (කෙටි කතාව)

"දැක්කොත් පද්මාවතී... ඕ... ඕ... පද්මාවතී දැක්කොත් පද්මාවතී" ඈතින් ඇසුණ ගී රාවයෙන් ගෙදර සියලු දෙනා ම කලබල විය.

"අන්න අම්මෙ තාත්තා අදත් බීල ද කොහෙ ද මම යනවා නිදාගන්න" කියමින් ලොකු පුතා පාඩම් කරමින් සිටි පොත වසා දැම්මේ ය. කාමරයට දුවගෙන ගියේ ය. පැදුරට වැටී, රෙද්ද ඔළුවේ සිට පෙරවාගෙන නිදා ගත්තේ ය.

පුංචි පුතා අම්මාගේ ගවුමේ එතෙමින් අම්මාට තුරුලු විය. ගීත නාදය ගෙදර ළඟට ම ආවේ ය. වසා තිබූ දොරට ගසමින් "නීතෝ නීතෝ මට බඩගිනියි බං මොනව ද කන්න තියෙන්නෙ?" කියමින් සිරිල් නිවසට ඇතුළු විය. ළඟ තිබූ පුටුවක් පෙරළා ගෙන තවත් පුටුවක වාඩි වූයේ ය.

"ආ! ආ! මෙන්න බත් කන්න" කියමින් නීතා කෑම ටික ළං කළා ය. වතුර වීදුරුව ද ළං කළා ය. මේසය පුරා බත් විසිරවමින් කටක් දෙකක් කෑවේ ය.

"මේව කන්න පුළුවන් ද බං හැමදා ම? කරෝල... කරෝල... කරෝල. කඩේ තියෙන්නෙ කරෝල විතර ද?"

"නෑ නෑ මස් මාළුත් තියෙනව. ඒවා ගන්න කෝ සල්ලි?"

"සල්ලි සල්ලි සල්ලි බල්ලොත් නොකන සල්ලි... මට එපා මේ කෑම. දාපං බල්ලට" කියමින් වැනි වැනී නැගිට්ටේ ය.

"කෝ මගෙ ලොකු එකා? ආ මේ ඉන්නෙ මගෙ පොඩි එකා" කියමින් පොඩි පුතාගේ අතින් ඇද්දේ ය. ඔහු අම්මාගේ ඇඟේ එතෙමින් සැඟවුණේ ය. නීතා කිසිවක් කථා නොකර මේසය පිරිසිදු කර කුස්සියට ගියා ය. පුංචි පුතා ද ඇය සමඟ ආවේ ය. සිරිල් තනියම කියෙව්වේ ය. සිංදු කීවේ ය. කාටදෝ බැණ වැදුණේ ය. ඒ සියල්ල ම නෑසූ කන්ව සිටි නීතා කුඩා දරුවා තුරුලු කරගෙන මිටි බංකුවේ වාඩි වූවා ය. ඇඳ සිටි ගවුමේ වාටියෙන් ගලන කඳුළු පිස දැමුවා ය.

ටික වේලාවකින් සිරිල් ගොරවන හඬ ඇසුණේ ය. නීතා දොර ජනෙල් වසා පුංචි පුතා සමඟ ලොකු පුතා නිදා සිටි තැනින් නිදා ගත්තා ය.

ඇය පාන්දර ම අවදි විය. කෑම බීම සූදානම් කර ලොකු පුතා පාසැල් යැවී ය. පුංචි පුතාව ළදරු පාසැලට ඇරලවී ය. නීතා ගෙට එත්ම සිරිල් ඇනුමක් අරිමින් නිදා සිටි ලණු ඇඳ මතින් නැගී සිටියේ ය. නීතා වහා උණු තේ කෝප්පයක් දුන්නා ය.

"කෝ නීතා දරුවො?"

"දරුවො බලන්න සිහි කල්පනාවෙන් එන්න එපායැ. දැන් ළමයි ඉස්කෝලෙ ගිහිල්ල. අම්මෝ ඔයාගෙ ඇස් දෙක ම රතු වෙලා. ගොරක මද වගෙයි".

"උෂ්ණෙට වෙන්න ඇති".

"එහෙම නම් අපේ ඇසුත් රතු වෙන්න එපායැ. ඔය හවසට බොන ඒවයෙ රඟේ වෙන්න ඇති. මොකක් ද සිරී මේකෙ තේරුම? ඔයා එන සද්දෙට ලොකු පුතා දුවල ගිහිං නිදා ගන්නවා. උාට පාඩම් වැඩ කරගන්නවත් වෙලාවක් නැහැ. එයාගෙ ශිෂ්‍යත්වෙත් ළඟ යි. පුතා හරියට මහන්සි වෙනවා".

"මගෙ කොල්ලා දක්ෂ යි".

"තාත්තා සිහි කල්පනාවෙන් ඉන්න එපායැ ඒවා බලන්න. පුතා නහයෙන් අඬනවා එයාට ළමයි විහිළු කරනවා කියලා. ඔයාගෙ සිංදු කැලි කියනව ලු. ඔයා වැනි වැනී එන හැටි පෙන්නනව ලු. අනේ සිරී ඔය බීම නවත්තන්නකො. මං ගැන හිතන්න එපා. මේ දරුවො ගැන පොඩ්ඩක් හිතන්නකො. ලොකු පුතා දැන් පංතියෙ කොන් වෙලා ලු ඉන්නෙ".

"අනේ නීතෝ මම මේ ඇඟේ අමාරුවට පොඩ්ඩක් බොන්නෙ. යාළුවොත් එක්ක කතා කර

කර පොඩි ජොලියක් දානවා තමයි. මම පොඩ්ඩයි බොන්නෙ".

"අනේ මගෙ කට; හොඳ පොඩ්ඩ. ඔයා ගෙට එනකොට ම ඔයාට කලින් ගඳ එනවා. ඒ පොඩ්ඩක් බීල ද? ඇගේ අමාරුවට මම වෙනිවැල් ගැට තම්බලා තියන්නම්. ඔයා වැඩ ඇරුන ගමන් ගෙදර එන්න. පුතාලා කොච්චර ආස ද ඔයා එක්ක කථා කර කර, විහිළු කර කර හුරතල් වෙන්න. ඉස්සර අපි කොච්චර සතුටෙන් ද හිටියෙ? ඇයි ඇයි සිරී ඔයා මේ වෙනස් උණේ?" කියමින් ඕ හඬන්නට වූවා ය.

"හරි හරි ඔන්න මම මීට පස්සෙ බොන්නෙ නැහැ. හවසට ඉක්මනට ගෙදර එන්නම්කො".

"බලන්නකො ඔයා ගන්න සල්ලි තැබෑරුමට දුන්නා ම අපි කොච්චර අමාරුවෙන් ද ජීවත් වෙන්නෙ? ගෙදර කොච්චර අඩු පාඩු තියෙනව ද?"

"හරි හරි නීතො මම බීම නවත්තනවා කිව්වනෙ".

නමුත් ඔහුගේ වචන ක්‍රියාවට නැංවුණේ නැත. තව තවත් බීම වැඩි වුණා පමණි. ගෙදර රණ්ඩු දබර ද පටන් ගැනිණි. නීතාගේ ඉවසීම නිසා ඒ ආරවුල් දුර දිග නො ගියේ ය. නමුත් ඇගේ ඉවසීම සීමාව පනින දවසට ගෙදර විශාල කාල ගෝට්ටියකි. සමහර දිනවල නීතාට පහර දීමටත් සිරිල් පෙලඹුණි. එහි ප්‍රතිඵලය වූයේ ලොකු පුතාට පාඩම් කිරීමට හෝ පොතක් පතක් කියවීමට හෝ නො හැකි වීම යි. දරුවා තව තවත් පංතියේ දී මුළු ගැන්විණි. ඔහුගේ අධ්‍යාපන කටයුතුත් අඩාළ විය.

දිනක් සිරිල් බීමතින් වැනි වැනී පාර පුරා ගමන් කරද්දී වාහනයක හැප්පුණි. ඒ වාහනයේ ම ඔහුව රෝහල් ගත කෙරිණි. පමණ ඉක්මවා මත්පැන් පානය කර සිටි නිසා ඔහුට කිසිදු වන්දියක් හෝ මුදල් ආධාරයක් හෝ නොදී බේරී යාමට රියදුරා සමත් විය. ඔහු දින ගණනාවක් රෝහල් ගත කළේ ය. කකුලේ ඇටයක් බිඳීම නිසා ප්ලාස්ටරයක් දමා නිවසට එවී ය. ඔහු ඇඳට ම සීමා විය. ඔහු සමඟ එකට මත්පැන් සාද ඇමූ කිසිවෙක් ඔහුගේ දුක සැප බැලීමට වත් නොපැමිණියහ. නීතාත් දරු දෙදෙනාත් ඔවුන්ට හැකි අයුරින් සාත්තු සප්පායම් කළෝ ය. දරුවන් පාසල නිමවා නිවසට පැමිණි විට තාත්තාටත් බත් කවමින් ඔවුනුත් කමින් සතුටින් ගත කළෝ ය. තාත්තාව මගහැරී තිබූ පුංචි පුතා තාත්තාගේ තුරුලෙන් ඉවත් වූයේ නැත. ලොකු පුතා නිදහසේ පාඩම් වැඩ කළේ ය. ඔහුගේ විෂය ගැටලු තාත්තාගෙන් අසා විසඳා ගත්තේ ය. ළදරු පාසලේ සිටින පුංචි පුතාට පින්තූර අඳිමින් රූප කපමින් තාත්තාත් පුතාත් සතුටු විය.

මෙසේ සතුටින් පසුවන විටෙක පුංචි පුතා "අම්මෙ තාත්තගෙ කකුල හොඳ වෙන්නෙ නැත්තම් ෂෝක් නේද?" යයි ඇසී ය. එය ඇසුණු සිරිල් "ඇයි පුතේ, එතකොට තාත්තට ඇවිදින්න බැරි වෙනවනෙ" යි කීවේ ය. එවිට දරුවා සුරතල් හඬින් ඇස් ලොකු කර, කට උල් කර "එතකොට හොඳයි. තාත්තාට අර අරවා බොන්න යන්න බැහැනෙ. පාරෙ සිංදු කියන්නත් බැහැනෙ. රණ්ඩු කරන්නත් බැහැනෙ" යයි කීවේ ය. එය ඇසුණ සිරිල් කල්පනාවට වැටුණි. මඳ වේලාවකින් පුතාව ළං කරගෙන ඔහුගේ හිස සිපිමින් "නෑ පුතේ, මම මීට පස්සෙ කවදාවත් අරවා බොන්නෙ නැහැ. ඔව් පුතේ මම පොරොන්දු වෙනවා. මම ආයෙ කවදාවත් බොන්නෙ නැහැ. ඔව් නීතා මම පොරොන්දු වෙනවා. මේ පුතාගෙ ඔළුවෙ අත තියලා මම පොරොන්දු වෙනවා. මේ ටික දවසට මට තේරුණා මට ඉන්නෙ ඔයාලා විතරයි කියලා. මට සමාවෙන්න නීතා. මගෙන් ඔයාලට ගොඩක් වැරදි උණා" කියමින් ඔහු නීතා දෙස කඳුළු පිරී දෙනෙතින් බලා සිටියේ ය.

"අනේ සිරී, කොච්චර දෙයක් ද ඔයා බොන්නෙ නැතිනම්. බලන්නකො අපිට කොච්චර අඩු පාඩු තිබුණත් දැන් අපි කොයි තරම් සතුටින් ද ඉන්නෙ කියලා. පුතාලත් කොච්චර සතුටින් ද ඉන්නෙ. ලොකු පුතා නිදහසේ ඉස්කෝලෙ වැඩ කරනවා" කියමින් නීතා සිරිල්ගේ පපුව මත සිය මුහුණ තබාගෙන හඬන්නට විය. සිරිල් ඇගේ හිස අත ගාමින් "මම පොරොන්දු වෙනවා නීතා, මම ආයේ කවදාවත් බොන්නෙ නැහැ" යයි කීවේ ය.

**ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න**

# ජීවිතය සුන්දර ද මෙතරම් ?

ජීවිත යනු සුන්දරව විඳිය යුතු දෙයක් විනා විඳ විය යුතු දෙයක් නොවේ. ජීවිතය දෙවිඳුන්ගෙන් අප ලද මහගු තිළිණයකි. එය ගරු කළ, පෝෂණය කර ආරක්ෂා කළ යුතු වේ. මතට, දුමට, හිත යොමු කරන්නේත් තම ජීවිතයට ඉඩ දෙන්නෙක් නොවෙයි. මත, දුම, තම ශරීරය, මනස විකෘති කරමින් පැයෙන් පැය වළපල්ලට ඔබව තල්ලු කරන විට ඔබ කෙලෙස ද ජීවිතයට ඉඩ දෙන්නෙක් වන්නේ. කාමය, රාගයට ඉඩ දෙමින්, නිල් චිත්‍රපටි, අසැබි පොත පත, වෙබ් අඩවි නරඹන ඉදිරියේ මුළු දිවිය ම විනාශ කරගන්නා වූ ඔබ ජීවිතයට ඉඩ දෙන්නෙක් නොවෙනු ඇත. ඔබ නොමරා මරනුයේ ඔබේ දිවිය යි.

අද රටේ වැඩි වශයෙන් කතා බහා කරනුයේ මත්ද්‍රව්‍ය, මත් පෙති, දුම්වැටි වේ. මිනිසා සිහින ලෝකවල මෙන් ම අන් අයගේ ජීවිත විනාශ කිරීමට ද සමත් ව ඇත. මේවා නිසා, ලේ වැගිරීම්, දූෂණය, මිනී මැරීම් බොහෝ සිදු වේ. මිනිසා ලෝකයේ ඉපදීමත් සමඟ ම විවිධ රෝග පීඩා, වේදනා, දුක් කම්කටොළු සහ පාපයේ බලපෑම්වලට ද මුහුණ දීමට සිදු වේ. දේව වචනය තුළ ජීවත් වන්නේ නම් ඒවාට මුහුණ දීමට ආත්ම ශක්තියත් ලබා ගත හැකි ය. දුක් වේදනා හඳුනා ගෙන උපකාර කිරීමට කිසිවකු නැතත් ජීවමාන සමිඳාණෝ අප සමඟ සිට එයින් අප නිසැකව ම මුදාගන්නා බව පැහැදිලි ය.

මිනිසා යහපත් ඇවැතුම් පැවැතුම්වලින් සමන්විත විය යුතු ය. මිනිසා නොමිනිසා වන ආකාරයේ ක්‍රියාවන් බොහෝ සිදු වේ. වැඩිහිටි පරපුර මෙන් ම බොහෝ ළමයි ද වර්තමානය වන විට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටිති. මත්ද්‍රව්‍ය බොහෝමයක් වන ගංජා, හෙරොයින්, කොකේන්, මෝෆීන්, එල්. එස්. ඩී, අබිං වැනි දෑ මත්ද්‍රව්‍ය ගණයේ සැලකෙන සමහරක් ය. මේවායින් ජීවිත හානි කරගන්නා රෝගාබාධයන්ට ද ගොදුරු වන ජනතාවට හෘදයාබාධ, පිළිකා, ආමාශයන් තුළ වණ, සිරෝසිස්, ස්නායු ආබාධ වැනි භයානක රෝග ගොදුරු වී විනාශ වෙති. ජීවිතය සුන්දර වන්නේ කොහොම ද?

තමන්ගේ හෝ අන් අයගේ ජීවිත විනාශ කිරීම හෝ ඊට අනුබල දීම බරපතළ වරදක් බව සෑම ආගමකින් ම පෙන්වා දී ඇත. දේව සමානකමට මවනු ලැබූ මිනිසාගේ පූර්ණ අයිතිය ඇත්තේ දෙවිඳුන් ම පමණයි. මව් කුසේ සිටින දරුවා ද වර්ධනය කරන්නේ දෙවිඳුන් ය. ඔබ මාගේ ඇතුළාන්තය මැවූ සේක. මා මව්කුසේ තැනූ සේක (ගීතාවලිය 139:13).

ජීවිත සුන්දරව ගත කරන්නට නම් මෙලොව එළිය දකින්න ආශාවෙන් සිටින බිළිඳා මරා දමන්න තැත් කරද්දී බිළිඳා තම ජීවිත ඉල්ලා තනිවම සටනක යෙදෙමින් ඉතා අමානුෂික ලෙස වද විඳ මිය යන්නට ඔවුන් කළ වරද කුමක් ද? සියලු සත්ත්වයෝ සුඛිත, මුදිත කරන පාරමිතා පුරන බෞද්ධ බහුතරය ඉන්නා රටේ දිනපතා ගබ්සා කර දරුවන් මරා දැමීම ගැන හඬක් නොනැඟීම පුදුමයට කරුණකි. ජීවිතයක් නැති කිරීම කිතුනු බෞද්ධ මුස්ලිම් අයගේ විශාලම පාපයකි.

බලාපොරොත්තුවේ වන්දනා ගමනකට යෙදීමට අප සූදානම් වන අවසන් කාල වකවානුව තුළ, මත්ද්‍රව්‍ය නිසා අයාලේ නොමඟට යොමුවන දරුවන් යහපත් මාර්ග වෙත යොමු කරන්නටත්, ගබ්සාව නැමති විෂබීජය රට තුළ නැති කර දමන්නටත් කාලය සකසා ගනිමු. අන් අය වෙනුවෙන් කැප වෙන්නට, වැය වෙන්න, කැඩෙන්නට,

බිඳෙන්නට උත්සහා දරනවා නම් අප ජීවත් වුවත් මළවුන්ගේ ජීවත් නොවී දෙවිඳුන්ගෙන් ලද ජීවිත තිළිණය විවිධ අයුරින් විනාශ නොකර ගෙන යහපත් ලෙස ජීවිත ගත කරමින් විනාශ මුඛයේ සිටින ඔබ මා ද, දෙවිඳුන් හට ළං වෙමින් වෙනසක් තුළින් දිවියට වටිනාකමක් දෙමින්, ජීවිතයට ඉඩ දෙමින් වැටී ඇති ආගාධයෙන් ගොඩ ඒමට සැබෑ පෞරුෂත්වයක් සැමට ලැබේ නම්, ජීවිතය සුන්දර වේ.

**කාමන් සකුන්තලා**
**විලගෙදර.**

# නත්තල ආවා, අපට කියන්නට රාලේ

ඒව ව රැවටූ නයා තහනම් ගහේ එල්ලිලා
නයාලූ කීවේ කන්නට කියලා බොරු සෝබන පෙන්නාලා
ඒවත් කෑව ලූ ආදම්ටත් දුන්න ලු, ඔහුත් කෑව ලූ අනේ එපා කියලා
කතන්දරයකින් මේ ගැන කීවා, ශුද්ධ වූ බයිබලේ පෙරලාලා

නාග ලොවේ සිට බුලත් කොලේ ගෙන නාගයා මෙහි පැමිණිලා
බුලත් කොලේ ගෙන දෙපැත්ත කඩලා කනවා විටක් කියලා
දුම්කොළ දමලා පුවක් ද දාලා හුණුත් දමාලා, කනවා චරබර ගාලා
රතු පාටින් කෙළ ගසනවා, සැම තැන වස විෂ පතුරාලා

කොරෝනා ආවා මිනිසුන් මැරුණා වස විස මිනිසා පතුරාලා
ඌරු මසේ විෂබීජ තියෙනවා කියලා කියනවා ඔහෙලා
ඇත්ත ද දන්නෑ උයලා කනවා පදමට මිරිස් දමලා
කනවා අපි රස කරලා, තරමක් බොනවා අපේ ම කම අවි ඇරලා


සිගරට් බොනවා, බීඩි උරනවා, ගංජා උරනවා, අයිස් ගගහ අපි ඉදලා
හැමෝම බොන්නෑ හොඳ අය ඉදලා අරුන් මැරෙනවා හිටලා
රෝහල් පිරිලා, බෙහෙත් ගන්නවා පෝලිම්වල තෙරපීලා
සීනි ද දන්නෑ ඩොක්ටර් කියනවා මැරෙන්ඩ යනවා ඔහෙලා

සමහරු කනවා කාටත් දෙන්නෑ තනියෙම කනවා හිටලා
කුකුලෝ අඬනවා, ඌරෝ අඬනවා හරකුත් අඬනවා නත්තල ආවා කියලා
මේවා දැකලා හිනහත් යනවා, ඔයාලා සල්ලි හොයනවා හිටලා
හවසට දුවනවා බල්ලත් දුවනවා ජෝගින් කියලා ඔහෙලා

පයින් ගමන නෑ කාරෙක යනවා පැට්‍රොල් ගහනවා හිටලා
සිංහල ජාතිය බෙදාන කෑවා ඒ ඉස්සර අපි පොඩි කාලේ
පාඩම් කෙරුවා සෙල්ලම් කෙරුවා ඒ අපි පොඩි පැටි කාලේ
පල්ලිත් යනවා, පන්සලටත් යනවා, නත්තල ආවා අපට කියන් ගම රාලේ

**එම්. ජී. ඩික්සන් ක්‍රිස්ටෝපර් ෆර්ඩිනැන්ඩස්**
**දෙහියාගාත, ජා ඇල.**

# ශුද්ධවර ජෝන් බොස්කෝ තුමා



මෙතුමා ක්‍රිස්තු වර්ෂ 1815 අගෝස්තු මස 15 වැනි දා මෙලොව එළිය දිටී ය. එතුමාණන්ගේ මෑණියන් ඔහුට දෙවිඳුන්ට ආදරය කරන ආකාරයත්, දිළිඳු පුද්ගලයනට කරුණාව දක්වන අන්දමත් ඉගැන්වූ අතර මොහුගේ පියා ගොවියෙකි. මොවුන්ගේ පවුල ඉතා දිළිඳු වූ අතර එතුමාණන්ගේ පියා මෙතුමා කුඩා කාලයේ දී ම මරණයට පත් විය. ඔහු තමාගේ මරණයට පෙර මුළු පවුල කැඳවා මෙලෙස ප්‍රකාශ කළේ ය.

“මට නුඹලාට දීමට මුදල් ස්වල්පයක් ඇත. එහෙත් මම දෙන දායාදය වන්නේ මෙය යි. කුමක් වුව ද ඔබේ විශ්වාසය දෙවියන් වහන්සේ තුළ තබන්න” යන්නෙන් පවසා සිටියේ ය. එම වදන් මොහුගේ හදවත විනිවිද යන්නට සමත් විය.

ජෝන් බොස්කෝ තුමා පාසල් යැවීමට සිය මෑණියන්ට කිසිදු වත්කමක් තිබුණේ නැත. එහෙත් ඇය මෙතුමාට දහම පිළිබඳව ඉගැන්වූවා ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මොහු තමන්ගේ මිතුරන් එකතු කොට ඔවුන්ට ධර්මය පිළිබඳ අවබෝධයක් ලබා දුන්නේ ය. සුවිශේෂ සිහින මඟින් අප කිතු තුමා හා දෙව් මවුන් ඔහුට දර්ශනය විය. යෞවනයන් පාපිෂ්ඨ මාර්ගවලින් ඉවත් කොට නිසි මඟ යැවීමටත්, ඔවුන් අවංකව විවිධ කර්මාන්තවල යෙදවීමටත් මෙතුමා කැඳවිණි.

එය ක්‍රියාවට නැඟිය යුත්තේ කාරුණිකව මෘදු ලෙස බැව් පහදා දිණි. මොහු දුටු ස්වප්න දෙවිඳුන්ගෙන් ලැබූ සුවිශේෂ අනාවරණ ලෙස මෙතුමෝ සැලකූහ. එබැවින් එම අනාවරණ ඉෂ්ට කිරීමට පූජකයෙකු වන්නට නොනිත් ආශාවක් මෙතුමා තුළ පැවතිණි. එහි ප්‍රතිඵලයක් ලෙස ජෝන් බොස්කෝ තුමාට යහපත්, ආදර්ශවත් පූජකතුමෙක් මුණ ගැසිණි. ඔහු මෙම ආකල්පය අවබෝධ කර ගත් පසු ඔහු පාසලකට ඇතුළත් කෙරිණි. මෙතුමා අධ්‍යාපනය නො ලබා සිටි හෙයින් මොහුට කුඩා දරුවන්ගේ පන්තියක ඉගෙන ගන්නට සිදු වූ අතර එහිදී ඔහු අවමානයට භාජනය විය. එහෙත් මොහු පූජකවරයෙකු වීමේ අදහස් නැති කර නො ගත්තේ ය.

සිය මෑණියන් දුප්පත් වූ නිසා ඔහුට පාසල් යන්නට ඇඳුම පිළියෙල කර ගැනීමට නොහැකි විය. එම ප්‍රදේශයේ යහපත් ප්‍රභූවරයන්ගෙන් ඇඳුම හා පාවහන් ඉල්ලා ගත් අතර එම එකම සපත්තු කුට්ටම ගෙවෙන නිසා බියෙන් පාර දිගේ හිස් පතුලෙන් ගොස්, පාසලේ ගේට්ටුවට සමීප වූ විට, එය පැළඳ ගනිමින් පාසලට ගියේ ය. එමෙන් ම නිවස තුළ මඳ ආලෝකයක් තිබෙන ඉටිපන්දමක ආලෝකයෙන් ස්වකීය පාසල් කටයුතු අවසාන කළේ ය. ජෝන් බොස්කෝ තුමා දිව්‍ය පූජා යාගයට සහභාගි නොවන ළමුන් කැඳවා ගනිමින් වීර මලල ක්‍රීඩා මාර්ගයෙන් ඔවුන් සතුටු කළ පසු මුළු පිරිස රැගෙන දිව්‍ය පූජාවට සහභාගි වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් දෙවිඳාණන් ඔහුට ආශීර්වාද කළේ ය. ටික කාලයකින් මෙතුමාට දෙව්සත්හලට ඇතුළු වන්නට අවස්ථාව ලැබිණි. දෙව්සත්හලේ පුහුණුවීම් කටයුතු නිමා වූ පසු 1841 ජුනි මස 05 වැනි දා ඔහු පූජකවරය ලැබී ය.

එතුමා පූජකවරයෙකු වීමෙන් අනතුරුව ටියුරින් නගරයට යැවිණි. ඉන් අනතුරුව ගෙවල් නොමැති දරුවන්, අධ්‍යාපනය නො ලැබූ පුද්ගලයන්, නගරය තුළ ඇවිදිමින් සිටින්නන්, කිසිදු අයෙකුගේ උදව්වක් නොලැබ සිටිය දී, ළමා කාලයේ

දී, තමන් ලද දේව පණිවිඩයට කීකරු වීමක් ලෙස ඔවුන් සියලු දෙනා එකතු කරගන්නා ලදී. කාරුණික අයෙකුගෙන් ලද කුඩා නිවස මෙම පිරිමි දරුවන්ගේ වාසය සඳහා පරිවර්තනය කෙරිණි. ඔවුන්ට අවශ්‍ය දේවල් මොහු ලබා දුන්නේ ය. ඔහු තම පියා මරණාසන්නව සිටි අවස්ථාවේ දී ප්‍රකාශ කළ දේව විශ්වාසයත්, බලාපොරොත්තුවත් වර්ධනය කර ගත්තේ ය. එපමණක් නොව ජෝන් බොස්කෝ මුනි තුමා දේව මැණියන්ගේ නො වරදිනසුලු මධ්‍යස්ථ භාවය පිළිබඳව ද දැඩි ලෙස අදහා ගත්තේ ය.

මෙම අසරණ දරුවන් රැක බලා ගැනීමට සහාය දීමක් ලෙස තම මැණියන් පැමිණි අතර දිව්‍ය සංරක්ෂණයේ බලය මගින් එම දරුවන්ගේ අවශ්‍යතා සඳහා සහයෝගය ලැබිණි. මෙම ආයතනය වර්ෂ 1856 වන විට දියුණු වූ අතර පිරිමි දරුවෝ 150 ක් පමණ සිටියහ. විවිධාකාර කර්මාන්ත, මුද්‍රණ ශිල්පය බඳු වෘත්තීන් ද පුහුණු කෙරිණි. එමෙන්ම 9 වන පියුස් ශුද්ධෝත්තම පියතුමාගේ දිරි ගැන්වීමෙන් අනතුරුව මෙතුමා පිරිමි ළමුන් 17 දෙනෙක් කැඳවමින් වර්ෂ 1859 දී සැලේසියානු තාපස පන්තිය ආරම්භ කළ අතර යැදුම හා ධර්මදූත සේවය ප්‍රධාන ක්‍රියාවන් ලෙස සැලකිණි. ඉන් පසුව බාලිකාවන්ට සහාය දීමට සැලේසියානු සොයුරියන්ගේ කණ්ඩායමක් ද පිහිටුවා ගැනිණි. ජෝන් බොස්කෝ මුනිඳුන් දේව සේවය අනුපමේය වෙහෙසකින් කළ අතර අවසානයේ දී ඉතා දුබල විය. 1888 වර්ෂයේ දී මෙතුමා දැඩි ලෙස රෝගාතුර වී තම යහනෙහි වැතිරගත් අතර "මගේ දරුවන්ට කියන්න. ඔවුන් එනතුරු මම ස්වර්ගයේ බලා සිටින අතර, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට හා දේව මැණියන්ව ඔවුන් සැම බාර දී ඔවුන්ට බිය වීමට කිසිදු දෙයක් නොමැති බවත්" යන්න ඔහුගේ අවසාන වදන විය. වර්ෂ 1888 ජනවාරි මස 29 වැනි දා ජෝන් බොස්කෝ මුනිඳුන් දේව දර්ශනය සඳහා මෙලොවින් සමුගත්තේ ය. ජෝන් බොස්කෝ මුනිතුමාගේ මංගල්‍යය සිදු කරන්නේ ජනවාරි මස 31 වැනිදා ය.

**මලින්ත බෝපෙආරච්චි**
**දළුගම, කැලණිය.**

# මත් රසින් මත් නොවී

දෙව් මැඳුරේ දී මා හට හැමදා මුණ ගැහෙන
සායනයට ගියා ම එහිදිත් දකින්න ලැබෙන
ඒ හැම විට දී යන්තම් හිනැහී හිස නමන
මිනිසෙකි ඔහු පැතු මත් රසින් මත්වන සරණ

රෙස්ටුරන්ට් එකට සවස පුරුදුව සිටි යන්න
ඔහු හට ඕනෑ මොනවා දැයි හොඳ හැටි දන්න
සේවක මහතාටත් හිත පිරෙන්න සලකන්න
අමතක කර නැති අන්දම හැකිය සිතා ගන්න

එහෙත් සිදුව ඇත්තේ දැන් සායනයට එන්න
බෙහෙත් ගෙනැත් දෙන්නයි සොඳුරියට ගෙදර ඉන්න
කකුලක් කපලා ලු ඇයට නොහැකි ලු ඇවිදින්න
ඉවුම් පිහුම් කරනවා ලු ඔහු හැටියට දන්න

රෝද පුටුව මතට වෙලා හැමදාමත් ඉන්න
ඇය හට දෙන්නේ නැති ලූ උදව් වෙන්න එන්න
දියණියට ද එන්න බැරි ලු දුරට දීග දුන්න
දීග දුන්න පසු ඕනෑ ම ලු නිදහස දෙන්න

නොහැකි ලු තම පුතා හටත් මෙලෙස ඉන්න දෙන්න
ඕනෑ ලු හොඳ කටයුත්තක් කරනවා දැක ගන්න
පුළුවනි ලු බිරිය ළඟට වෙලා ඔහුට ඉන්න
මතක ලු ඇය ආදරයෙන් සැමදා හැටි උන්න

මත්පැන් තොල ගාගෙනවිත් තනිව ම සැතපෙන්න
හිත දෙන්නේ නැති ලු ඔහුට රෙස්ටුරන්ට් යන්න
සුව කරගත් පසුව ඇයව හැකි ලු එතෙක් ඉන්න
බැරි ලු කොහොමවත් යන වියදම ද දරා ගන්න

අඹු දරුවන් සිටිනවා දැයි නැති ගානට දන්න
මත් වීමත් රසින් කැමති හොඳට පදම් වෙන්න
වහලුන් සිටිනා ලොව තුළ මෙම පාඩම දුන්න
ඔහු හා එම පිනැත්තියව ගියෙමී දැක ගන්න

**පස්කල් ජයමාන්න - උස්වැටකෙයියාව**

# DRUGS ARE DANGEROUS AND HARMFUL TO OUR CULTURE AND CHILDREN

I will start my article with what is Alcohol?

It is a drug. Most people drink for the stimulant effect such as Beer or a glass of Wine. But if a person drinks more than the body can handle then they experience alcohol's depression effect. Alcohol overdose causes severe depressant effect. There are different kind of alcohol. Ethyle alcohol or we called Ethanol is produced by fermenting grains and fruits. It is a chemical process. Beer and Wine contain 2% to 20% alcohol but liquor contain 40% to 55% or more alcohol. As many are consuming liquor, wine 7% to 20%, Rum 40% - 45%, Brandy 40%, Gin 40%, 48%, Whiskey 40% - 50%, Arrack 40% - 45%, Vodka 40% - 50%.

Any alcohol is directly absorbed into the blood stream within few minutes' travels from stomach to the brain and effect will be slowing the action of nerve cells. When the amount of alcohol in the blood exceeds, the breathing system slows down can cause coma, vomiting or death because oxygen no longer reaches the brain. Long term effects of using alcohol amounts liver disorder, nerve damage, brain damage, sexual problems, malnutrition, gastritis and cancer. With road accident fatalities exceeding 2,200 in 2024 and continuing to rise in 2025, Sri Lankas roads are among the most dangerous in South Asia. According to the WHO the country has an estimated road traffic death rate 19.7 per 100,000 population. Most of the accidents are due to negligent and driving after liquor.

<u>What was the first drug used in history?</u>

People discovered Opium Poppies (Ganja) in the Mediterranean, and Cannabis and Tea in Asia. Cannabis seeds appear in archaeological digs at 8100 BC in Asia.

Heroin was first made by C R Alder Wright in 1874 from Morphine, a natural product of the Opium Poppy. Internationally heroine is controlled under Conventional Narcotic Drags Law and it is illegal to make or possess or sell.

It is with question that drug abuse is damaging to the health, safety and well-being of a society and that it bears heavily upon the sanctity of the people living within effected communities.

The prevalence of addiction not only reduces productivity and hinders development but also proves harmful to family structures and can be detrimental to the future potential of children who face drug abuse within the household or among their family members. It is a cancerous situation to the entire nation. Statistics reveal according to National Drugs Control Board;

- In 2019 - 89,000 people were arrested
- In 2023 - 162,000 people were arrested

There is a new trend of increasing use of Synthetic drugs known as ICE (Methamphetamine Crystals) among school girls and boys. According to N D D C B, Colombo, Gampaha, Kandy, Kurunegala are being widely used ICE, and identified as high-risk areas.

Children are the back born of a nation, that's why children are considered to be the future pillars of the nation, we all die then who will take care of the land, the country if children are abused.

Children are precious. They should be given proper place to come into ladder as great future leaders. The earliest influences to smoke, drink alcohol or use drugs may come from the family and society. Factors that are related to drug use during adolescence, include poor self-image, low religiosity, poor school performance, parental rejection and neglect, family financial problems and family disputes, abuse, divorce etc.

<u>The Law relating to Sri Lanka</u>

Several amendments were brought to the offences relating to drug offences in Sri Lanka over last 20 years. Even the penalty of death (which Sri Lankan Courts have interpreted as non mandatory) or life imprisonment accuses for manufacture of Heroine, Cocaine, Morphine or Opium and the trafficking, possession, import or export of minimum amount of 500 Grams of Heroin, 3 Grams of Morphine and 2 Grams of Cocaine etc., as amended Act 13 of 1983 and latest further amended as 41 of 2022 in the Poisonous Opium and Dangerous Drugs Ordinance.

It is sad to say the number of murders related to narcotic drugs has increased since 2013 with a jump in 2024. The Law itself cannot change the prevailing situation.

**Godfrey Cooray**

Senior Attorney-at-Law

Former Ambassador to

Norway, Finland and Iceland

President, National Catholic Writers' Association

# ඕං එහෙනං



රටක් විලස හදවත් තුළ කම්පනයන් ඇති වේවා
කිසිදා නො වුණු මහ විපතක් අත්දකින්න සිදු වූවා
විනාශයේ ගැඹුරු තරම තේරුම් ගෙන දුක් වේවා
අපේ ම ජනතාව වෙතට සියලු ම අත් යොමු වේවා

මානුෂීය සත්කාරය විගසින් පිළියෙල වූවා
දිවා රැයක් නො බලා කොයි කවුරුත් කැප වූවා
දෙන්න තියෙන හැකි තරමට හොඳ හිතින් ම පිරී නැමුවා
ශ්‍රී ලංකා මිනිසුන්ගේ ළෙන්ගතු බව දිස් වූවා

අසල්වැසි රටත් විගසින් අප පිහිටට අත දුන්නා
අනිත් රටවලුත් මනුසත් බව තුළ ගැළවුම්කරුවන් වූවා
හමුදාවන් දිවි නොතකා ක්‍රියාන්විතය ඇරඹූවා
ඒ හින්දා බොහෝ දෙනකුට දිවි ගෙවුමට හැකි වූවා

රජය මට්ටමින් දිය හැකි උපරිම දේ සිදු වෙනවා
සීමාවකින් තොරව ජනතා සෙත සලසනවා
මේවා බලන් ඉන්න බැරිව වාචාලයෝ දොඩවනවා
බල ලෝභය මතු කරමින් අවස්ථාව පෙන්වනවා

හැම දෙනා ම එකතු කරත් අදහස් විමසා සිටිනවා
ඒ අනුව ම දිය හැකි උපරිම සහාය ලබා දෙනවා
තත්පරයත් විනාඩියත් ඒ වෙනුවෙන් කැප කරනවා
නායකයගේ මිනිසත්කම සැබෑ ලෙසින් මතු වෙනවා

මෙවන් වේදනා ගෙන දෙන විනාශයක් නොම වේවා
වැටුණු තැනින් ගොඩ එන්නට හැම දෙනාට හැකි වේවා
අපෙන් වෙන්ව ගිය අය හට සග ලොව නිවන් හිමි වේවා
අවතැන් වූ සත් ජන හට ඉක්මන් සුව අත් වේවා

රැජස් ප්‍රැන්සිස්

# 25 න් 26 ට...

කට්ට කෑවූ අවුරුදු යුග
එළිය දැකලම නැද්ද
කෑවූ ගොඩක් අස්සේම
සුදුත් තිබිලම නැද්ද


සතුට හනිකට ගියද
දුකම පැල් බැඳ ගෙනය
හඳ නොමැති රෑකටත්
තරු , එළිය දුන් නැද්ද
දුකම හිමි උණි එකත
වේලකට ජෝලි නැද්ද

ගිලන් වී සිටියදිත්
හීනියට ඇලවෙන්න
උරහිසක් නැතිමනම්
කෑ ගහල වැලපෙන්න
පිරල ඉතිරිල ගියත්
කටු පදුරු මාවතම
පිදුරු ගහ උණත් ඇති
එල්ලිලා ගොඩ යන්න



චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

## අමිතගේ හද ගැස්ම ........



# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



ආදර දුවේ, පුතේ, අද ඔයාලත් එක්ක සිදුවීම් කිහිපයක් බෙදාගන්න මම කැමතියි.

අශේන් අට වසරේ පුතෙක්. එයා ඉගෙන ගත්තෙ ආසන්නතම නගරයේ ප්‍රධාන පිරිමි පාසලක. ගමේ ඉඳන් නගරයට අශේන් පාසල් ආවෙ කුඩා පාසල් බස් රථයකින්. මේ පාසල් බස් රථය හරි ම විනෝදෙන් පිරුණු තැනක්. සිනා කවට කතා, සින්දු, සාද අඩුවක් නෑ. මොකද දවසට පැය දෙක තුනක් ම ගත වුණේ පාසල් බස් රථයෙනෙ. පිටුපස ම ආසනය වෙන් වෙලා තිබුණෙ සාමාන්‍ය පෙළ, උසස් පෙළ අයියලාට. කාලයක් යද්දි මේ අයියලාගෙ හැසිරීම් වෙනස් වෙනවා. එයාල අනිත් අය එක්ක කතා නෑ. එයාලගෙ ම රහස් ලෝකයක හැංගිලා. හවසට එද්දි එයාලගෙ හැසිරීමත් අමුතු යි. මත් වෙලා වගේ කතා නෑ. සමහරු නිදි. මේ අයියලා එක එක විදියෙ බෝතල්වල දාගත්ත බීමත් බොනවා. දවසක් අශේන්ටත් බලෙන් ම ටිකක් පෙව්වා. ඒ බීම රස යි. ඒත් ටිකකින් කැරකිල්ල වගේ දැනුණා. එදා අශේන් මේ ගැන ගෙදරට කිව්වා. ඒ ගැන සැකයක් ඇති වුණු අශේන්ගේ තාත්තා දෙමව්පියන්වත් දැනුවත් කරලා දවසක් පාසල් බස් රථය පරීක්ෂා කළා. එයාලට හමුවෙන්නෙ මොනව ද දන්නව ද? මත් බීම සහ මත් පෙති.

ඔන්න එක අම්මා කෙනෙක් දවසක් මෙහෙම කිව්වා දහම් පාසලේ ටීචට. "අපේ දුව හරිම වෙනස්. ඉස්සර වගේ නෙවෙයි. කොච්චරවත් කාමරේට වෙලා. වැඩිය කතා කරන්නෙත් නෑ. දොර ලොක් කරගෙන පාඩම් කරනවා කියල තමයි කියන්නෙ. ඒත් ලකුණු එන්න එන්නම අඩු වෙනවා. හැසිරීමත් අමුතුයි". දහම් පාසල් ගුරුතුමිය දුන්නු උපදෙස තමයි මුලින්ම දොර ලොක් කරගන්න බැරිවෙන්න අගුල් අයින් කරන්න කියන එක. ඒ වගේම ඇය යන එන තැන්, හමුවෙන අය ගැන නිතර සෙවිල්ලෙන් ඉන්න කියන එක. මේ සෙවිල්ලෙදි තමයි අම්මා දැනගන්නෙ තමන්ගෙ දුවට ප්‍රේමවන්තයකු ඉන්න බව. ඒ වගේ ම එයා මතට ඇබ්බැහි වුණ කෙනකු බව. දුව බොහොම අවදානම් තැනක ඉන්න බව.

ඔන්න සාමාන්‍ය පෙළ විභාගය ඉවර වුණු ගමන් යාළුවො ටිකක් පොඩි ට්‍රිප් එකක් යනවා. පුදුමාකාර පීඩනයකින්නෙ එයාල මෙතෙක් ජීවිතය ගත කළේ. ලැබුණු නිදහස උපරිමයෙන් භුක්ති විඳින්න තමයි ඕන. මෙයාල යන්නෙ වැඩිය කවුරුත් නොගැවසෙන කැලයක් මැද දිය ඇල්ලක් ළඟට. එදා කට්ටිය මත් පැන් පානය කරනවා. සින්දු කියනවා. වතුරෙ බැහැගෙන නටනවා. එක යාළුවෙක් දිය සුළියකට අහු වෙනවා. එයාව බේරගන්න තවත් යාළුවෙක් පනිනවා. හැබැයි එයාලට වතුර එක්ක සටන් කරන්න අමාරු යි. මොකද මත් වෙලානෙ ඉන්නෙ. ඒ වෙලාවට කරන්න ඕන මොනව ද කියල පැහැදිලි මනසකුත් නෑ. අන්තිමේ යාළුවො තුන්දෙනෙකුගෙ ම නිසල සිරුරු එක්ක තමයි ආපහු ගම්වලට යන්න වෙන්නෙ.

දුවේ, පුතේ, මේ වැනි සිදුවීමකට මුහුණ දෙන්න සිදු වුණොත් ඔබ මොකද කරන්නේ? ඔබේ යහළුවකු මෙවැනි අනතුරකට මුහුණ දෙනව නම් ඔබ මොකද කරන්නේ? ඔබේ ජීවිතයටත්, පොදුවේ මේ රටටත් මේ මොහොතේ මුහුණ දෙන්නට සිදු වී ඇති බරපතළ ම ව්‍යසනයන් අතරින් ඉතා විනාශකාරී ම අනතුර මත්ද්‍රව්‍ය උවදුර බව ඔබ දන්නවා ද? එය කෝටි ගණන් මුදල් උපයන්න හැකි ව්‍යාපාරයක් බවට පත්වෙලා. දරුවන් සහ තරුණ තරුණියන් තමයි මත්ද්‍රව්‍ය බෙදාහරින්නන්ගෙ ප්‍රධාන ඉලක්ක වෙලා තියෙන්නෙ. රසවත් ටොෆියක්, චොක්ලට්ටුවක්, බීමක්, මත් පෙත්තක්, මත් වතුරක් මේ ඕනෑම ස්වරූපයකින් මත් උවදුර ඔබ සොයා පැමිණිය හැකියි.

සිහිකල්පනාවෙන් ජීවත් වෙන්න. ජීවිතය කියන්නෙ හරිම වටිනා තෑග්ගක්. ඒ ජීවිතය මත් රකුසාට විනාශ කරන්නට ඉඩ දෙන්න එපා.

තරු නැන්දා

## ප්‍රහේලිකා අංක - 89

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | 2 | | | | ■ | 3 | | ■ |
| | ■ | | ■ | ■ | ■ | 4 | | ■ | 5 |
| 6 | | | 7 | 8 | | ■ | 9 | | |
| | ■ | 10 | | | ■ | 11 | | ■ | |
| 12 | | ■ | 13 | | 14 | | ■ | 15 | |
| | ■ | 16 | | ■ | 17 | | 18 | | |
| | ■ | ■ | ■ | 19 | | ■ | 20 | | ■ |
| | ■ | 21 | ■ | ■ | ■ | 22 | ■ | ■ | 23 |
| ■ | 24 | | | 25 | | | 26 | ■ | |
| 27 | | | ■ | | ■ | 28 | | | |

හරහට

1. විෂ මත්ද්‍රව්‍ය මෙරටින් මුලිනුපුටා දැමීම සඳහා වර්තමානයේ ක්‍රියාත්මක වන ජාතික මෙහෙයුම.
3. "හොරා" යන්නෙහි ස්ත්‍රී ලිංග පදය.
4. ඇතුන් සතු දෙයකි.
6. කතෝලික සභාවේ ප්‍රධාන සාමාජිකත්වය.
9. දේශීය පලතුරකි.
10. වහලේ උළු රඳා සිටීමට අවශ්‍ය වේ.
11. "දැඩි බව" සමාන පදයකි.
12. ආගමන කාලයේ ජනවන්දනා (දේවවන්දනා) වර්ණය
13. B1 ලෙස සලකන B විටමිනයට කියන තවත් නමකි.
15. මාළු ඇල්ලීමට යොදා ගනී.
16. කරන කාර්යයකට ගෙවන මුදල.
17. මුතු නිපදවන සත්වයා.
19. ජැමෙයිකාව බෙදී ඇති ප්‍රාන්ත තුනෙන් එකකි.
20. "නළාව" බහු වචනය.
24. ආගමන කාලයේ ප්‍රධාන තේමාව.
27. පහතරට සිට උඩරට රාජධානියට ඇතුළු වන කඩුගන්නාව ප්‍රදේශයේ පිහිටා ඇති දුර්ගය.
28. "බිහි කරනවා" යන්නට සමාන පදයකි.

පහළට

1. මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය.
2. සපුෂ්ප ශාකයක මල් හට ගැනෙන කොටස.
3. 'දේශීය වෙද' යන අර්ථය ගෙන දේ.
5. ඉතාමත් සෙමින් බඩ ගා යන සත්වයෙකි.
7. රාකෙල්ගේ සේවිකාව වන වේල්හාට දාව උපන් ජාකොබ්ගේ හයවන දරුවා.
8. වස්තුවක උෂ්ණත්වය වෙනස් කරන්නා වූ ශක්තිය.
11. "කෙදි" සමාන පදයකි.
14. නකල්ස් කඳු පන්තියට ආසන්නයේ පිහිටි සංචාරක ප්‍රදේශයකි.
15. මුහුදේ වෙසෙන විශේෂිත මාළු ප්‍රභේදයකි.
18. සතුන් විසින් ගස්වල නිර්මාණය කරනු ලබන කුඩු විශේෂයකි.
21. මත්ද්‍රව්‍ය වැටලීම් සිදුකරන දූෂණ මර්ධන ඒකකය පිහිටි ප්‍රදේශය.
22. "ග්‍රහණයට ලක්ව" යන්නට සමාන අරුත් දේ.
23. නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවට බලපෑ සුළි කුණාටුව
24. "බලනවා" යන්නෙහි විධි ක්‍රියා පදය.
25. මී මැස්සන්ගේ ආහාරය.
26. වියළි කලාපයේ සුලබව දැකිය හැකි මල් විශේෂයකි.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා,**
සාන්ත වින්සෙන්ති නිවාසය,
මග්ගොන.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2026 පෙබරවාරි 15** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 89**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 87 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ආ | ධා | ර | | 2 ජෙ | ප් | ෂ් | ය | | 3 ක |
| නා | | | 4 ප | | | | | 5 මි | ණි |
| 6 ජු | 7 සේ | 8 තු | මා | | 9 ම | 10 යු | ර | | ෂ් |
| 11 ව | ර | ම් | | 12 ඔ | ළු | ව | | 13 පා | ය |
| කී | | 14 මෝ | ල් | ටා | ව | | 15 ක | ර | |
| 16 නු | 17 රු | ද | | වා | | 18 වැ | ව | | 19 අ |
| | 20 පු | ර | 21 ය | | 22 ප | ඩි | ය | | ත් |
| | සෙ | | තු | | | හි | | | දැ |
| 23 අ | න් | 24 ද | ර | 25 ය | | 26 ටි | 27 ක | | කී |
| ද | | මි | | 28 ම | හී | | 29 න | ව | ම |

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕින්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 87 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 87 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය -** ෂෙහාරා අංජලි පෙරේරා, 11 ශ්‍රේණිය, යහපත් එඬේරා කන්‍යාරාමය, පානදුර.
- **දෙවන ස්ථානය -** ටෙවිස් නයිජල්, 8 ශ්‍රේණිය, පමුණුගම මහා විද්‍යාලය, බෝපිටිය.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2026 මාර්තු / අප්‍රේල් - "ආදරය"**
(2026 මාර්තු - අප්‍රේල් කලාපය සඳහා ඔබ එවන ලිපි 2026 ජනවාරි 15ට පෙර අප වෙත එවන්න.)
**2026 මැයි / ජූනි - "බලාපොරොත්තුවේ අම්මා"**
(2026 මැයි / ජූනි කලාපය සඳහා ඔබ එවන ලිපි 2026 මාර්තු 15ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

1. 1. ශුද්ධවූ පාවුලු තුමා ලිපි ලිවීමේ පරමාර්ථ දෙකක් ලියන්න.
   2. ශුද්ධ බයිබලයේ අඩංගු නොවන නමුත් කතෝලික සභාව අනුගමනය කරන හා උගන්වන කරුණු ලැබී ඇත්තේ කුමන මූලාශ්‍රයකින් ද?
   3. ශුද්ධ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති කෘති දෙක නම් කරන්න.
   4. ක්‍රි.ව. 80-96 අතර කාලයේ කිතුනුවන්ට දරුණු පීඩා කළ රෝම අධිරාජ්‍යයා කවුරුන් ද?
   5. අභිධාර්මික ප්‍රඥාව ගැන සඳහන් වන පුරාන ගිවිසුමේ ග්‍රන්ථ 2ක් ලියන්න.
   6. INRI යන්නෙහි අර්ථය කුමක් ද?
   7. පෙන්තකොස්ත දින දී ශුද්ධාත්මයාණන් වැඩම කළ බවට සලකුණු දෙකක් ලියා දක්වන්න.
   8. අපෝස්තුලුවරු දොළොස් දෙනා අතරින් පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා කවුරුන් ද?
   9. පේදුරු තුමාගේ මහා ප්‍රකාශය සිදු වූයේ කොහේ දී ද?
   10. ශුද්ධවූ ජුසේවාස් මුනිතුමාව භාග්‍යවරයට හා ශුද්ධවරයට එසවූ ශුද්ධෝත්තම පියවරු දෙදෙනා නම් කරන්න.

2. 1. ඉතාලියේ ලන්චියානෝ නුවර දිව්‍ය සත්ප්‍රසාදීය ප්‍රාතිහාර්ය සිදු වූ දේවස්ථානය කැප කර ඇති මුනිතුමා කවුරුන් ද?
   2. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට වන්දනා කරන අවස්ථා 3ක් ලියන්න.
   3. අපගේ ජීවිතය තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ගෞරවය දැක්විය හැකි අවස්ථා මොනවා ද?

3. 1. ජුදෙව්වන් වසරක් පාසා උත්සවාකාරයෙන් පැවැත්වූ මංගල්‍යය කුමක් ද?
   2. ජුදා පාස්කු මංගල්‍යයේ මූලිකාංග 3ක් නම් කරන්න.
   3. ඉශ්රායෙල් ජනතාව මිසරයේ දී කළ වහල් ක්‍රියා 5ක් ලියන්න.

4. 1. උත්තම පූජක යාච්ඤාව පුරා දිව යන තේමාව කුමක් ද?
   2. උත්තම පූජක යාච්ඤාවේ ප්‍රධාන කොටස් 3 නම් කරන්න.
   3. කිතුනු සහා එකමුතුව වෙනුවෙන් මෑත කාලයේ ගත් පියවර මොනවා ද?

5. 1. ශුද්ධවූ සභා විනය හා සෙසු කාරණා පිළිබඳ නීති ඇතුළත් වන්නේ කුමක් තුළ ද?
   2. සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ලබා ගත යුතු අවස්ථා 3ක් ලියන්න.
   3. ශුද්ධවූ සභාවේ ශික්ෂා පද 5 නම් කරන්න.

පිළිතුරු

1. 1. කාර්ය බහුලත්වය නිසා කිතුනු සංඝ බැහැ දැකීමට යාමේ අපහසුව.
   සිරගත වීම නිසා කිතුනු සංඝ බැහැ දැකීමට යාමේ නොහැකියාව.
   2. ජීවන සහා සම්ප්‍රදායකි. 3. දානියෙල් පොත හා එළිදරව් පොත 4. ඩොමීෂියන් අධිරාජයා
   5. ජෝබ් හා ධර්මදේශකයා 6. "ජේසු නසරේනු ජුදයන්ගේ රජ"
   7. සැඩ සුළඟ හමන්නාක් වැනි හඬක් පැමිණීම.
   ගිනි දිව් බෙදී ගොස් ඔවුන් එකිනෙකා මත පිහිටීම.
   8. ශුද්ධවූ මහා ජාකොබ් හෙවත් සන්තියාගෝ මුනිතුමා 9. පිලිප්පි කයිසාරියේ දී
   10. භාග්‍යවරයට - ශුද්ධවූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා / ශුද්ධවරයට - ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

2. 1. ශුද්ධ වූ ලෙගොන්ෂියන් මුනිතුමා
   2. මහ බ්‍රහස්පතින්දා, සන්ධ්‍යා මෙහෙය තුළ, දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයේ දී, මාසයේ පළමු සිකුරාදා
   3. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමෙන් / දේවස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තැන්පත් කර ඇති විට දණ නමස්කාර කර යාච්ඤා කිරීමෙන් / දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවට සම්බන්ධ වීමෙන්

3. 1. පාස්කු මංගල්‍යය
   2. පාස්කු බැටළුවා / නුමුහුන් පූප / තිත්ත පලා / මිදි යුෂ
   3. කුඹල්, ගඩොල්, කෘෂි කර්මාන්තවල යෙදීම / ගබඩා නගර ඉදි කිරීම / බර වැඩ කිරීම / බලහත්කාරයෙන් වැඩ ගැනීම නිසා වූ පීඩන

4. 1. එකමුතුකම
   2. තමන් වහන්සේ වෙනුවෙන් යාච්ඤා කිරීම / ශ්‍රාවකයන් වෙනුවෙන් යාච්ඤා කිරීම / අනාගත සභාවේ එකමුතුකම වෙනුවෙන් යාච්ඤා කිරීම.
   3. සෑම වසරකම ජනවාරි මාසයේ 18 - 25 දක්වා සභා සමගිය උදෙසා යැදුම් සතියක් පැවැත්වීම / ආගමික, සමාජීය කටයුතුවල දී සුහදතාවයෙන් කටයුතු කිරීම / දේව ධාර්මික එකඟතා මුල් කරගෙන සිදු වන ශාස්ත්‍රීය සහ ධාර්මික සාකච්ඡා හා සංවාදවලට සහභාගි වීම / ශ්‍රී ලංකා කතෝලික රදගුරු මණ්ඩලය සහ පිළිගත් කිතුනු සභා එකඟත්වයෙන් 1983 දී නව සිංහල ශුද්ධ බයිබලය දොරට වැඩීම.

5. 1. සභා නීති සංග්‍රහය
   2. මරණීය පාපයක් සිදු වූ විගස / මරණීය පාපයක් නැතත් වසරකට වරක් සමගි සන්ධානය ප්‍රසාද නිධානය ලබා ගත යුතු ය / සුළු පාපයක් සිදු වූ විට
   3. ඉරු දිනත් ණය මංගල්‍යය දිනත් මුළු පූජා යාගයට සහභාගි වීම / වසරකට වරක්වත් පාපොච්චාරණය කිරීම / පාස්කු සමය තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම / නියම වූ දිනයන්හි ගොඩමස් වැළකීම හා එක්වරුශීල රැකීම / ශුද්ධ වූ සභාවේ නඩත්තුව සඳහා ආධාර දීම.

**ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු / පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

# පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය හා ගීතාවලිය II

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

## ගීතාවලිය

### හැඳින්වීම

හෙබ්‍රෙව් ජනතාව තම දේව නමස්කාරය හා ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ ආධ්‍යාත්මික පැවැත්මට හා භාවනාවට මෙම කෘතිය යොදා ගෙන ඇත. මෙම පුස්තකයේ අන්තර්ගතය තුළ ස්තෝත්‍ර ගීත හා ඔවුන්ගේ පෞද්ගලික යාච්ඤා ඇතුළත් ය. ජෙරුසලමේ දේව මාළිගාවේ මෙන් ම වන්දනා ගමන්වල දී ද දෙවි සමිඳාණන් වහන්සේට තුති ප්‍රශංසා ගීත ගැයීමට මෙම පොතේ ඇති ගීත භාවිත කර ඇත. මේ තුළ අන්තර්ගත යාච්ඤාමය ගීත 150 කි. එම යුගයේ මෙම ගීත ගායනා කර ඇත්තේ තත් සහිත වාදන භාණ්ඩ උපයෝගී කරගෙන ය. (උදා - වයලීනය) දෙවි සමිඳාණන් වහන්සේගේ මැවිල්ල කෙරෙහි සතුටට පත් මිනිසා ඒ සඳහා ප්‍රශංසා කිරීමට එම ගීත ගායනා කර ඇත. තවත් විටක මිනිසාට ඇතිවන දුක, මනස්ථාපය හෝ විලාපය වෙනුවෙන් එම ගීත භාවිත විය.

ගීතාවලිය සඳහා හෙබ්‍රෙව් බසින් "සේෆර් තෙහිලිම්" හෙවත් "ප්‍රශංසා පොත" ලෙස හැඳින් වේ. "තෙහිලිම්" ලෙස අර්ථ දැක්වෙන්නේ තත් සහිත වාදන භාණ්ඩයන් භාවිත කර ගීත ගැයීම යි. ශුද්ධ ලියැවිල්ලේ ග්‍රීක පරිවර්තනය (සෙප්ටුවාජින්ත පිටපත) ගීතාවලිය හඳුන්වන්නේ "ප්සල්මෝස්" ලෙස ය. ඉන් අදහස් වන්නේ ගීතාවලියේ ගීත ගායනා කිරීම සඳහා වූ පද මාලාවක් බව ය. ඒවා පදමාලාවන් පමණක් බවත් උච්චාරණය සඳහා නොවන බව ය. එම ගීත සඳහා භාවිත වන ඉංග්‍රීසි වචනය "සාම්ස්" ලෙස ය. එය "ප්සල්මෝස්" යන ග්‍රීක නාම පදයෙන් බෙදී ඇත.

### පසුබිම

ගීතාවලිය සම්බන්ධයෙන් බයිබලීය විශාරදයන් අතර මත කිහිපයක් ඇත.

1. හර්මන් ගුන්කල් නැමති විශාරදයා පවසන්නේ පුරාණ ඉශ්‍රායෙල් ජනතාවගේ ජනවන්දනාව හේතුවෙන් මෙම ගීත බිහි වන්නට ඇති බව ය. විප්‍රවාසය මෙන් ම පශ්චාත් විප්‍රවාසි සිදුවීම් ද තේමා කර ගනිමින් ඔහු පෙන්වා දෙන්නේ පුරාණ ඇදහිලි ගීතවල අනුකරණයන් බව ය.
2. ආතර් වයිස් නැමති බයිබල් විශාරදයා පෙන්වා දෙන්නේ එම ගීත ගිවිසුම් මංගල්‍යය හා සම්බන්ධව ගොඩ නැඟී ඇති බව ය. එහෙත් ගිවිසුම ආශ්‍රිතව මංගල්‍යයන් පවත්වා ඇති බවට තොරතුරක් නොමැත.
3. "සිග්මන්සි මොවින්කල්" පෙන්වා දෙන්නේ තෙහිලි ගීතවල ආරම්භය යාවේ දෙවියන් වහන්සේගේ සිංහාසනාරූඪ මංගල්‍යයෙන් ආරම්භ වූ බව ය. එවැනි මංගල්‍යයන් පුරාණ ඉශ්‍රායලයේ පවත්වා ඇතැයි ද තොරතුරක් නොමැත.

කෙසේ වෙතත් කිව හැක්කේ ගීතාවලියට ඇතුළත් තෙහිලි ගීත බොහොමයක් පුරාණ ඉශ්‍රායලිය ජනවන්දනාව තුළින් ගොඩ නැඟී ඇති බව ය. කරුණු කෙලෙස වාර්තා කළත් පෙනී යන සාහිත්‍යමය මූලාශ්‍රයක් වන්නේ ගීතාවලිය පොත කුඩා ගීත කොටස්වල එකතුවක් ලෙස බිහි වී ඇති බව ය. උදාහරණ ලෙස පෙන්වා දිය හැක්කේ දාවිත්ගේ ගීත, කෝරාගේ ගීත, ආසාක්ගේ ගීත මෙම කෘතියට ඇතුළත් වී ඇති බව ය.ඉන් අදහස් වන්නේ ඉහත නම් සඳහන් කළ තිදෙනා මෙම පොත ලියූ බව නොවේ. මන්ද ගීතාවලිය පොතේ ගීතිකා වර්ගීකරණය කිරීමේ දී දාවිත්ගේ ගීතිකා රාජකීය ගීත වශයෙන් ද ආසාක්ගේ ගීතිකා දේව මාළිගා ගීත වශයෙන් ද සැලකේ.

### ගීතාවලියේ කර්තෘත්වය

බොහෝ දෙනා පිළිගත් මතය වන්නේ එම පොතේ කර්තෘවරයා ක්‍රි.පූ. 1000-960 දක්වා ජුදයාව පාලනය කළ දාවිත් රජතුමා බව ය. එයට හේතුව

වන්නේ ඉශ්‍රායලිය ජනවන්දනා සංගීතය කෙරෙහි දාවිත් රජතුමාගේ අවධානය යොමු වී ඇති බැවිනි. කෙසේ වෙතත් බබිලෝනිය විප්‍රවාසය සිදු වූ ක්‍රි.පූ. 597 පසුව ද ඇතැම් සිදුවීම් ගීතයෙන් වර්ණනා කර ඇත. ක්‍රි.පූ. 597 වන විට දාවිත් රජු මිය ගොස් වසර 400 පමණ ආසන්න වේ. එම නිසා කර්තෘත්වය සම්බන්ධව ගැටලු සහගත තත්ත්වයක් මතු වේ. එම තත්ත්වයට හේතු දෙකකි.

1. දාවිත් රජතුමා විසින් ම ලියන ලදැයි සැලකෙන ලද ගීතිකාවල විප්‍රවාසයේ දී ජෙරුසලෙම විනාශ වීමෙන් පසු අවධිය ගැන ඉඟි කරයි. ජෙරුසලෙම විනාශ වූයේ දාවිත් රජුගේ ඇවෑමෙන් බොහෝ කලකට පසුව ය. එසේ ම හෙබ්‍රෙව් භාෂා ශෛලිය ද පශ්චාත් විප්‍රවාසි යුගයට අයත් ය. එය එක් ගැටලුවකි.
2. ඇතැම් ගීතිකා ඉතාම පැරණි බවක් ගනී. උදාහරණ 110 ගීතය එම නිසා ඇතැම් ගීතිකාවල කර්තෘත්වය දාවිත් රජතුමාට ආරෝපණය කර ඇති බව පෙනේ.

<u>ගීතාවලිය පොත කාණ්ඩ කිරීම</u>

පංච පුස්තකය හෙවත් "ටෝරා"ව යාවේ සම්ප්‍රදායට (J) අනුගතව ගීතාවලිය පොත ද කාණ්ඩ 5කට බෙදා වෙන් කර ඇත. එනම්,

1. තෙහිලි ගීත 1 - 41 දක්වා
2. තෙහිලි ගීත 42 - 72 දක්වා
3. තෙහිලි ගීත 73 - 89 දක්වා
4. තෙහිලි ගීත 90 - 106 දක්වා
5. තෙහිලි ගීත 107 - 150 දක්වා

මෙම කාණ්ඩකරණයේ දී එම පොත් අවසාන වන්නේ දේශ ප්‍රශංසාවකිනි. තෙහිලි ගීත සඳහා අනු අංක යෙදීමේ දී එක් තෙහිලි ගීයක වෙනසක් දැකිය හැකි ය. මන් ද ග්‍රීක පිටපත රචනා කිරීමේ දී එම වෙනස්කම සිදු වී ඇත.

<u>ගීතිකා වර්ගීකරණය</u>

ගීතිකා වර්ගීකරණය කිරීමේ දී ද විශාරදයන් අතර විවිධ මත පවතී. එහෙත් ඉශ්‍රායලීය ජනතාව දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට භාවිතා කළ ගීත මෙලෙස වර්ගීකරණය කළ හැක.

1. **ප්‍රශංසා ගීත** - දෙවියන් වහන්සේගේ උත්කෘෂ්ඨ මැවිල්ල සහ ගැලවීමේ ක්‍රියාවලිය වෙනුවෙන් උන් වහන්සේගේ යහපත්කම, කරුණාව වෙනුවෙන් උන් වහන්සේට ප්‍රශංසා කිරීම.
2. **විලාප ගීත** - ඉශ්‍රායෙල් ජනතාවට කරදරයත්, ආපදාවක් පැමිණි විටක දෙවියන් වහන්සේගේ රැකවරණය පතා යදින ගීතිකා
3. **තුති දීමේ ගීත** - දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව ලබා දුන් වරප්‍රසාද සඳහා තුති ප්‍රශංසා කිරීම.
4. **ප්‍රඥා ගීත** - ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීමට ජනතාව පොලඹවන ගීත
5. **රාජකීය ගීත** - රජ කෙනෙකුගේ අභිෂේකය, විවාහ මංගල්‍යය යන අවස්ථාවලදී ගයන ගීත
6. **ජනවන්දනා ගීත සහ සියෝන් ගීත** - ජෙරුසලෙම් දේව මාළිගාවේ මංගල්‍යයන් සඳහා වන්දනාවේ යන විට ගායනා කරන ගීත
7. **විශ්වාසයේ ගීත** - දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසය තහවුරු කරන ගීත මෙම ගීතවලට අයත් වේ.

<u>ගීතාවලිය පොත දේව වන්දනාව සඳහා භාවිතය</u>

ගීතාවලිය පොත දෙවියන් වහන්සේගේ දයාව කරුණාව වෙනුවෙන් ප්‍රශංසා කරන්නා වූ ගීත නිර්මාණයකි. ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ විශේෂ වූ අවස්ථාවල දී ගීතාවලිය පොතෙන් එතුමන් ද පිළිතුරු සපයාගෙන ඇත.

උදා - කන්ද උඩ දේශනාව, කුරුස ගසේ දී

එම නිසා වර්තමාන දේව වන්දනාවේ දී ද පළමු දේව ප්‍රකාශනයට පසුව පිළිතුරු ගීය සඳහා ගීතාවලිය පොතෙන් කොටසක් භාවිත කෙරේ.

සටහන : **ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**


TRANSWORLD GLS
CARRYING CARGO WITH CARE
A subsidiary of
TRANSWORLD GROUP SINGAPORE
Air Freight
Liner Agency
Supply Chain Solutions
Sea Freight
Inland Logistics
ISO Tanks
Projects
10 countries
36 offices
BLPL SINGAPORE
BLPL FAITH
BLPL
BEST COMPLIMENTS FROM
TRANSWORLD GLS (LANKA) PVT LTD
Ceylinco Houe, No 69. 8th Floor, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka T.P +94 11 7634170/77 FAX +94 11 2481020
OUR PRESENCE
SINGAPORE
VIETNAM
MALAYSIA
INDIA
MYANMAR
SRI LANKA
THAILAND
CHINA
INDONESIA
AFRICA

# කුරුණෑගල ජෝසප් වාස්


## උසස් අධ්‍යාපන ආයතනය මගින් මෙහෙයවනු ලබන

## ද්වීමාසික පූර්ණ ඉංග්‍රීසි නේවාසික පාඨමාලාව

ව්‍යාකරණ, කථනය, භාෂා උච්චාරණය, ලිවීම, සවන්දීම පිළිබඳව ප්‍රමාණවත් දැනුම් සම්භාරයකින් සිසු සිසුවියන් සන්නද්ධ කරවන ද්වී මාසික පූර්ණ ඉංග්‍රීසි පාඨමාලාව

**සදාචාරාත්මක පැවතුම් සහ යහපත් ආකල්පයන්ගෙන් සිසු සිසුවියන්ගේ ජීවිත හැඩගැන්වීම සඳහා:**

- භාවාත්මක ඥානය විකාශ කරවීම (Emotional Intelligence)
- නායකත්ව පුහුණුව (Leadership Training)
- සමාජ චාරිත්‍ර විධි පිළිබඳව අවබෝධය (Social Etiquttes)
- උපදේශණය (Counselling)
- ජීවිත ආරක්ෂණය (Life Saving)
- කෘෂිකාර්මික පුහුණුව (Agriculture Training)




**පාඨමාලා ආරම්භය:**
**2025-01-05**
**පන්නල IHFC මධ්‍යස්ථානයේදී**

**අප ආයතනයේ හැදෑරිය හැකි වෙනත් පාඨමාලාවන්:**

- Pearson HND in Business Management
- Pearson HND in Computing
- Top-Up Degree in Business Management and IT
- AQUINAS Diploma in English (Level 1 to Final)
- Diploma in Teacher Training
- TEFL (Teaching English as a Foreign Language)

විමසීම්: Very Rev. Fr. Sagara Prishantha Perera - Director | 071 20 300 77 | www.jvi.lk | info@jvi.lk

Affiliated Study Center of: IDM Pearson UNIVERSITY OF GLOUCESTERSHIRE TVEC Registration: P12/0226

මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ 10 එස්. එස්. ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/MAGAZINE/03/2026